# විධායක සාරාංශය

**ශ්‍රී ලංකාව ඉතා විශාල වාසිදායක ධාරාවන් දෙකක් මත රඳා පවතී.** මින් පළමු ධාරාවට මෙම රට, පහළ ආදායම් තත්ත්වයේ සිටින රටක සිට මධ්‍ය ආදායම් ලබන රටක තත්ත්වයක් වෙත පරිවර්තනය කළ හැක. දෙවන ධාරාවට මෙම රට, ගැටුම්කාරී වාතාවරණයක සිට සාමකාමී වාතාවරණයක් ලෙසට පරිවර්තනය කළ හැක.

**රන් හා සමාන මෙම වාසිදායක තත්ත්වයන්හී හිණිපෙත් හරහා ශ්‍රී ලංකාව සාර්ථකව ඉදිරියට ගෙන යාමට උසස් අධ්‍යාපන අංශයට හැකියාව ඇති අතර එසේ කළ යුතුවේ.** රටෙහි වර්ධනය මධ්‍ය-ආදායම් ලබන රටවල තත්ත්වයට වේගවත්ව ළඟා කරවීම සහ ඉහළ නැංවීම සඳහා උසස් අධ්‍යාපන ආයතන දායක විය යුතු වේ. තවද, ශ්‍රී ලංකාව බහු වාර්ගික, බහු ආගමික සහ බහු සංස්කෘතික සාමකාමී සහ පිබිදුණු සමාජයක් බවට පත්කිරීමට නම්, උසස් අධ්‍යාපන ක්‍රමය සාරධර්ම, ආචාර ධර්ම සහ සමාජ සංස්ථාවන් දිරිමත් කළ යුතු වේ.

## ශ්‍රී ලංකාව උසස් අධ්‍යාපන ආයතනයන්හී අදාළත්වය සහ ගුණාත්මක භාවය වැඩි දියුණු කළ යුතු අතර, විශිෂ්ට ගණයේ උපාධිධාරීන් බිහි කළ යුතු වේ.

**විසි එක්වන සියවසෙහි ගෝලීය දැනුම් ආර්ථිකය තුළ ශ්‍රී ලංකාවේ අනාගතය ඉතා විශාල ලෙස රඳා පවතිනුයේ රටෙහි බුද්ධිමය සහ මානව ප්‍රාග්ධනය මතය.** වර්තමානයේදී දැනුම් ආර්ථික දර්ශකය (KEI) තුළ ශ්‍රී ලංකාව ස්ථානගත වී ඇත්තේ රටවල් 140 කින් 82 වන ස්ථානයේ ය. පහත දැක්වෙනුයේ (පළමු ප්‍රස්ථාරයෙහි) මධ්‍ය ආදායම් උපයන රටවල් සඳහා සාමාන්‍යය දැනුම් ආර්ථික දර්ශකයයි. ගෝලීය තරඟකාරී දර්ශකය තුළ ශ්‍රී ලංකාව රටවල් 134 කින් 77 වන ස්ථානයේ පසුවෙයි. සෞභාග්‍යමත් මධ්‍ය ආදායම් උපයන රටක තත්ත්වය වෙත වර්ධනය වීමට නම්, ශ්‍රී ලංකාවට වේගවත් ආර්ථික සංවර්ධනය ප්‍රවර්ධනය කළ හැකි පර්යේෂණ සහ නව සොයාගැනීම් සිදු කිරීමේ හැකියාව අවශ්‍ය කරයි. නිර්මාණාත්මකව සිතීමට සහ ක්‍රියා කිරීමට, උද්යෝගීව හා ඵලදායීව වැඩ කිරීමට මිනිසුන්ට ඇති හැකියාව සහ ආර්ථික ක්‍රියාකාරකම් ශක්තිමත් කිරීමට නව තාක්ෂණයන් සොයා ගැනීම සහ ඒවාට අනුගත වීම මෙම අරමුණ ළඟා කර ගැනීම සඳහා ප්‍රධාන වශයෙන් වැදගත් වේ. මෙම සංදර්භය තුළදී,

**ප්‍රස්ථාරය 1: දැනුම් ආර්ථිකය: ශ්‍රී ලංකාව සහ මධ්‍යම ආදායම් ලබන රටවල් (MICs)**




*මූලාශ්‍රය: World Bank Knowledge Economy Statistics.*

කුසලතා  පරිපූර්ණ, මහන්සි වී වැඩ කරන සහ ව්‍යවසායික උපාධිධාරීන් බිහිකළ හැකි උසස් අධ්‍යාපන ක්‍රමයක් ලංකාවට අවශ්‍ය වේ.

**වර්තමානයේදී උසස් අධ්‍යාපන අංශයේ ගුණාත්මක භාවය සහ ආර්ථික අදාළ භාවය මධ්‍යම ආදායම් ලබන රටක් වීමට අවශ්‍ය කරන මට්ටමට වඩා සත්‍ය වශයෙන්ම පහළ මට්ටමක පවතී.** උසස් අධ්‍යාපන ආයතනයන්හී (HEIs) ගුණාත්මක භාවයෙහි පුළුල් මට්ටම් තුනක් වේ. මෙම ගුණාත්මක පරිමාපකයේ පහළ කෙළවරෙහි ඇත්තේ ගුණාත්මක බවින් අඩු අධ්‍යාපන ආයතන, වැඩසටහන් සහ පාඨමාලාවන්ය. මෙම උසස් අධ්‍යාපන ආයතන වලින් බිහිවන උපාධිධාරීන්ගෙන් අති විශාල බහුතරයකට පෞද්ගලික අංශයේ රැකියා ලබා ගැනීමට නොහැකි තත්ත්වයක් උදාවන අතර,රාජ්‍ය අංශයේ  රැකියා නිර්මාණය කිරීමේ වැඩසටහන් (Public sector make-work schemes) හරහා අවසානයේදී ඔවුන් සේවයේ යෙදවෙති.පහළ ගුණාත්මක භාවය සහ රටෙහි විශාල සංඛ්‍යාවක් සේවා වියුක්ත සහ ඌන සේවා නියුක්ත උපාධිධාරීන් ඇති වීමට හේතු වන පැහැදිලිම සහ තියුණුම උදාහරණය නම් විශ්වවිද්‍යාල තුළ පවතින බාහිර උපාධි පාඨමාලාවන්ය(EDPs). ඊට අමතරව, විශේෂයෙන්ම උතුරු සහ නැගෙනහිර පළාත් වැනි සංවර්ධනය අඩාල ප්‍රදේශවල සහ මෙම පහළ මට්ටමේ ක්‍රියාකාරීත්වයක් සහිත ආයතන ගණයට වැටෙන අළුතෙන් පිහිටවනු ලැබූ විශ්වවිද්‍යාල සහ උසස් තාක්ෂණික ආයතන (ATIs) අතර තවත් බොහෝ උසස් අධ්‍යාපන ආයතන ගණනාවක් ඇත.

මෙම ගුණාත්මක භාවය පිළිබඳ දර්ශකයේ මැද කොටසට අයත් වන මධ්‍යස්ථ ගුණාත්මක භාවයකින් යුතු උසස් අධ්‍යාපන ආයතන, වැඩසටහන් සහ පාඨමාලාවන් ඇත. මෙම ආයතන වලින් බිහිවන උපාධිධාරීහු සමහරක් පෞද්ගලික අංශයේ රැකියා සොයා ගැනීමට සමත් වෙති. නමුත් මෙම උසස් අධ්‍යාපන ආයතනවල උපාධිධාරීහු සැලකිය යුතු ප්‍රමාණයකට පෞද්ගලික අංශයේ රැකියා නොලැබෙන අතර අවසානයේදී ඔවුහු රාජ්‍ය සේවයෙහි රැකියා නිර්මාණය කිරීමේ වැඩසටහන් වෙත ඇද ගනු ලැබේ. පහළ මට්ටමේ සහ මැදි මට්ටමේ ක්‍රියාකාරීත්වයක් සහිත උසස් අධ්‍යාපන ආයතනයන් හී උපාධිධාරීන් හට ඇති පශ්චාත් උපාධි අධ්‍යාපන ඉඩ ප්‍රස්ථා හිඟ වේ.

ගුණාත්මක භාවය මිනිනු ලබන පරිමාණයේ ඉහළ කෙළවරේ පවතිනුයේ පහළ මධ්‍යම ආදායම් ලබන රටක් සඳහා සාපේක්ෂ වශයෙන් හොඳ තත්ත්වයේ පවතින උසස් අධ්‍යාපන ආයතන, වැඩසටහන් සහ පාඨමාලා ඉතා සුළු ප්‍රමාණයක් පමණි. මෙම උසස් අධ්‍යාපන ආයතන වලින් පිටවන උපාධිධාරීන් හට ආර්ථික සහයෝගීතාවය සහ සංවර්ධනය සඳහා වූ සංවිධානයට (OECD) අයත් රටවල් ද ඇතුලුව ශ්‍රී ලංකාව තුළ සහ විදේශයන්හී පෞද්ගලික අංශයේ ශ්‍රම වෙළෙඳපොළ තුළ දැඩි ඉල්ලුමක් පවතී. මීට අමතරව, මෙම ආයතන වලින් බිහිවන විශිෂ්ටම උපාධිධාරීන් හට ඇමෙරිකා එක්සත් ජනපදය, එක්සත් රාජධානිය, ඔස්ට්‍රේලියාව, ජපානය සහ අනෙකුත් ආර්ථික සහයෝගීතාවය සහ සංවර්ධනය සඳහා වූ සංවිධානයට අයත් රටවල් සමූහයෙන් රටක් වැනි රටවල ඇති හොඳම විශ්වවිද්‍යාල වල පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු සඳහා පහසුවෙන් අවස්ථා උදා කර ගත හැකි වේ. මෙම කුඩා, හොඳින් ක්‍රියාත්මක වන අංශය, උසස් අධ්‍යාපන අංශයෙහි දීර්ඝකාලීන ප්‍රතිඥාව සහ හැකියාව පෙන්නුම් කරයි. මෙහිදී මුහුණපෑමට සිදු වන අභියෝගය නම් පහළ මට්ටමේ කුසලතා සහිත ආයතන විශාල සංඛ්‍යාවක් අවසානයේදී උසස් මට්ටමේ කුසලතා සහිත ආයතන බවට පත් කිරීම සඳහා ඊට පෙර මධ්‍යම මට්ටමේ කුසලතා සහිත ආයතන බවට පත් කිරීමයි.

## *අභියෝග*

**උසස් අධ්‍යාපන අංශයෙහි ආර්ථික අදාළත්වය කෙරෙහි බලපාන ගැඹුරු සහ නොවෙනස් අභියෝග තිබේ.** දීර්ඝ කාලයක සිට පැවතෙන විශ්ව විද්‍යාල උපාධිධාරීන් අතරේ ඇති සේවා වියුක්ති ගැටලුව පිළිබඳව කඩිනමින් කටයුතු කිරීම අවශ්‍ය වේ. මෙම ගැටලුව සාධක කිහිපයක් හේතුවෙන් හට ගැනීමට හැකි බව පෙනෙන්නට තිබේ. එනම් (අ) උපාධිධාරීන් සතු සාපේක්ෂ වශයෙන් අවම මට්ටමේ පවතින කුසලතා, විශේෂයෙන් බාහිර උපාධි සහ දුරස්ථ මාදිලියේ පාඨමාලා සහ සමහරක් කලා, වාණිජ සහ විද්‍යා පාඨමාලා වලින් බිහිවන්නන් මීට අයත් වේ. (ආ) පෞද්ගලික අංශයේ කාර්යක්ෂමව වැඩ කිරීම සඳහා අවශ්‍ය කුසලතා සහ ආකල්ප උපාධිධාරීන් තුළ අවම බවට බොහෝ පෞද්ගලික අංශයේ සේවායෝජකයන් තුළ පවතින ආකල්පය සහ (ඇ) අතීතයේදී මන්දගාමී ආර්ථික වර්ධනයක් තිබූ කාලපරිච්ඡේද වලදී, එනම් රැකියා උත්පාදනය යටපත් වූ සහ රජය රැකියා නිර්මාණය කිරීමේ වැඩසටහන් සඳහා බඳවා ගැනීමේ යෝජනා ක්‍රම තුළින් රාජ්‍ය අංශය තුල රැකියා සඳහා බඳවා ගැනීම් සිදුවන කාලයේදී විශේෂයෙන්ම බාහිර උපාධි සහ දුරස්ථ අධ්‍යාපන මාධ්‍ය උපාධි වැඩසටහන් සහ කලා, වාණිජ විද්‍යා පාඨමාලා වල උපාධිධාරීන්ගේ දැනුම සහ කුසලතා මෙන්ම ඔවුන්ගේ රැකියාවන් පිළිබඳ ආකල්පයන් සහ උනන්දුව ආර්ථිකයේ අවශ්‍යතාවයන්ට වඩාත් අභිමුඛ වන පරිදි සැකසීම අවශ්‍ය කෙරේ.

**මධ්‍යම ආදායම් ලබන රටක ශ්‍රම වෙළෙඳපොළ සඳහා සාමාන්‍ය කුසලතා ඉතා වැදගත් වන නමුත් විශේෂයෙන්ම එය ශ්‍රී ලංකාව තුළ හිඟ වේ. මෙම හිඟ සාමාන්‍ය කුසලතා අතර ඉහළින්ම පවතිනුයේ ඉංග්‍රීසි භාෂා සහ තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ කුසලතා ය.** ජාත්‍යන්තර භාෂාවක් ප්‍රගුණ නොකළ සහ තොරතුරු සන්නිවේදන තාක්ෂණය පිළිබඳව දැනුම නොමැති

උපාධිධාරියකු විසි එක්වන සියවසේ දැනුම සහ තොරතුරු වලින් ඈත් වූ අයෙකු බවට හැඳින්විය හැක. ඒ අතර රැකියාවේදී ඔහුගේ හෝ ඇයගේ ඵලදායීතාව සහ ක්‍රියාකාරීත්වය තාක්‍ෂණික විශේෂඥයන් විසින් අපේක්‍ෂා කරනු ලබන මට්ටමට වඩා පහළ මට්ටමක පවතිනු ඇත. විශාල උපාධිධාරීන් ප්‍රමාණයකගේ ඉංග්‍රීසි භාෂා කුසලතා පෞද්ගලික අංශයේ ආයතන විසින් අපේක්‍ෂා කරන මට්ටමට වඩා බොහෝ පහළ මට්ටමක පවතී. තවද, උසස් අධ්‍යාපන ආයතනයන්හි තොරතුරු සන්නිවේදන තාක්‍ෂණ පහසුකම් සහ විද්‍යුත් ඉගෙනුම් සම්පත් ළඟා කරගැනීමට ඇති ඉඩකඩ සහ විද්‍යුත් ඉගැන්වීම් සඳහා අවශ්‍ය උපකරණ කිසිසේත්ම මධ්‍යම ආදායම් ලබන ආර්ථිකයට ප්‍රමාණවත් නොවේ.

**උසස් අධ්‍යාපන ආයතන සහ කර්මාන්ත අතර දැඩි විද්‍යා, තාක්‍ෂණ සහ නවෝත්පාදක සබඳතා මැදි ආදායම් ලබන රටවලට අත්‍යාවශ්‍ය වේ. එහෙත් ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල සහ කර්මාන්ත අතර සබඳතා පවතිනුයේ ළදරු අවධියකය.** සෞභාග්‍යමත් මැදි ආදායම් උපයන ශ්‍රී ලංකාවක ආර්ථිකමය මාර්ගය පදනම් වනු ඇත්තේ තොරතුරු තාක්‍ෂණය සහ මෘදුකාංග සංවර්ධනය, ඉංජිනේරු විද්‍යාව, කාර්මික සැකසුම්, බැංකු, මූල්‍ය,සහ රක්‍ෂණ වැනි දැනුම් - සූක්‍ෂම ක්‍රියාකාරකම් මතය. වර්තමානයේදී මෙම ක්ෂේත්‍රයන්හී රටට සිදුකළ හැකි ප්‍රමාණය සහ ඒවායේ තත්ත්වය සංවර්ධනය වෙමින් පවතින සහ ආදර්ශ මැදි ආදායම් ලබන රටවල් සඳහා වන සාමාන්‍යයට වඩා බොහෝ පහළ මට්ටමක පවතී. (1 වන වගුව බලන්න). මෙම දැනුම් සූක්‍ෂම සහ තාක්‍ෂණ- සූක්‍ෂම ක්‍රියාකාරකම් හී විශ්වවිද්‍යාල සහ කර්මාන්ත අතර සමීප සම්බන්ධය, රටෙහි ආයතනවල කාර්යක්‍ෂමතාවය සහ තරගකාරීත්වය වැඩි දියුණු කිරීම සඳහාත්, ආර්ථික වර්ධනය වේගවත් කිරීම සඳහාත් කඩිනමින් සිදුවීම අවශ්‍ය කෙරේ.

**වගුව 1: නවෝත්පාදක හැකියාව සහ තරගකාරීත්වයඃශ්‍රී ලංකාව කෙරෙහි ගෝලීය දෘෂ්ටිය**

| | වෙළඳාම සහ සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ සමුළුව (UNCTAD) නවෝත්පාදක ශක්‍යතා දර්ශකය | එක්සත් ජාතීන්ගේ කාර්මික සංවර්ධන සංවිධානය (UNIDO) තරගකාරීත්ව කාර්මික කාර්යක්‍ෂමතා දර්ශකය | ලෝක ආර්ථික සමුළුව (WEF) ගෝලීය තරගකාරීත්ව දර්ශකය |
|---|---|---|---|
| බංග්ලාදේශය | 106 | 56 | 107 |
| කාම්බෝජියාව | - | - | 110 |
| ඉන්දියාව | 83 | 40 | 48 |
| ඉන්දුනීසියාව | 87 | 38 | 54 |
| දකුණු කොරියාව | 19 | 10 | 11 |
| මැලේසියාව | 60 | 15 | 21 |
| මොංගෝලියාව | 69 | - | 101 |
| පාකිස්ථානය | 100 | 49 | 92 |
| පිලිපීනය | 64 | 25 | 71 |
| **ශ්‍රී ලංකාව** | **79** | **62** | **79** |
| සිංගප්පූරුව | 26 | 1 | 7 |
| තායිලන්තය | 54 | 23 | 28 |
| වියට්නාමය | 82 | - | 68 |

*මූලාශ්‍රයඃ "Universities and National Innovation Systems", ඇල්ෆ්‍රඩ් වොට්කින්ස්, ලෝකබැංකුව, 2007 වසරේ දෙසැම්බර් මස මැලේසියාවේදී පැවැත්වූ උසස් අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සඳහා ක්‍රමෝපායික මාර්ග පිළිබඳ සමුළුවේ දී ඉදිරිපත් කරන ලද්දකි. සටහන.*

## ක්‍රමෝපායික සංවර්ධන විකල්පයන්

**බාහිර උපාධි වැඩසටහන් පවත්වාගෙන යනු ලබන විශ්වවිද්‍යාල එම වැඩසටහන් වල ක්‍රියාකාරීත්වය පිළිබඳව දැඩි සැලකිල්ලෙන් පසුවීම මෙම වැඩසටහන් ශක්තිමත් කිරීම සඳහා ඉතා වැදගත් වේ.** බාහිර උපාධි වැඩසටහන් හී ගුණාත්මක භාවය ඉහළ නැංවීම සඳහා ක්‍රමෝපායයන් කිහිපයක් ඇත. බාහිර උපාධි වැඩසටහන් සඳහා සුදුසුකම් ලැබීමට සහ උපාධිය ලබාගැනීමේ ක්‍රියාවලිය සඳහා ශිෂ්‍යයන් සූදානම් කරවන පෞද්ගලික ආයතන සඳහා බලපත්‍රකරණ වැඩපිළිවෙලක් හඳුන්වාදීම අවශ්‍ය කෙරේ. මෙමඟින් එවැනි ආයතනවල තිබිය යුතු අවම ගුණාත්මක මට්ටම ඇති බව තහවුරු කෙරෙනු ඇති අතර බාහිර උපාධි වැඩසටහන් සඳහා ලියාපදිංචි වන ශිෂ්‍යයන් හට පාරිභෝගික ආරක්‍ෂාව සලසනු ඇත. බාහිර උපාධි වැඩසටහන්හී ගුණාත්මක භාවය වැඩි දියුණු කිරීමේ එක් විකල්පයක් ලෙස, දැනට බාහිර උපාධි වැඩසටහන් ඔස්සේ විවෘත විශ්ව විද්‍යාල මඟින් සපයනු

ලබන සේවා පිළිබඳව දැඩි විශ්වාසයක් තැබිය හැක. ඊට අමතරව, මෙම බාහිර උපාධි වැඩසටහන් හී ගුණාත්මක භාවය වැඩි දියුණු කිරීමේ ඥාණාන්විත ප්‍රවේශයක් නම් විශ්වවිද්‍යාල තුළ පවතින විද්‍යුත් උපකරණ වඩා ක්‍රමානුකූල ලෙස භාවිතා කිරීමයි. මේ අනුව, කොළඹ විශ්වවිද්‍යාලයේ පරිගණක පාසල අනෙක් විශ්වවිද්‍යාල වලටද කදිම ආදර්ශයක් වේ.

**සිසුන්ගේ ඉංග්‍රීසි භාෂා සහ තොරතුරු සන්නිවේදන තාක්ෂණ කුසලතා සංවර්ධනය කිරීම මගින් ඔවුන්ගේ අනාගත සේවා නියුක්තිය පිළිබඳ අපේක්ෂා සහ රැකියාවේදී ඵලදායීතාවය ඉතා අධික ලෙස වැඩි දියුණු වනු ඇත.** මෙම මූලාරම්භය විශේෂයෙන්ම අවශ්‍ය කරනුයේ කලා, මානව ශාස්ත්‍ර, වාණිජ සහ සමාජ විද්‍යා ශිෂ්‍යයන්ටය. සේවායෝජකයන්ට අනුව, ඉංග්‍රීසි භාෂා සහ තොරතුරු සන්නිවේදන තාක්ෂණ කුසලතා පිළිබඳ මොවුන් තුළ වන අඩු දැනුම, මෙම උපාධිධාරීන් තුළ දැකිය හැකි ප්‍රධාන දුර්වලතාවයක් වේ. කලා, මානව ශාස්ත්‍ර, වාණිජ සහ සමාජ විද්‍යා උපාධි පිරිනමන විශ්ව විද්‍යාල සහ පීඨයන්, තොරතුරු සන්නිවේදන තාක්ෂණික උපකරණ, සිසු - ගුරු හමුවීම් සහ තම ශිෂ්‍යයන්ගේ ඉංග්‍රීසි භාෂා සහ තොරතුරු තාක්ෂණ කුසලතා වැඩිදියුණු කිරීම සඳහා, භාෂා කුසලතා උපාර්ජනය සඳහා ශිෂ්‍ය උපකාරය වැනි ගුණාත්මක ක්‍රියාවලීන් සංවර්ධනය කිරීම ආදිය ඇතුලුව, අතිරේක සම්පත් කෙරෙහි අවධානය යොමු කළ යුතු වේ. මෙය පැහැදිලි, බහුවිධ වාසි උත්පාදනය කරනු ඇති ක්‍රමෝපායික ප්‍රාරම්භකයකි. එය ශිෂ්‍යයන් අතර ජනප්‍රිය වනු ඇත. එය වැඩ ලෝකය තුළ ඔවුන්ගේ අනාගත ක්‍රියාකාරීත්වය පිළිබඳ ඉහළ බලපෑමක් ඇති කරනු ඇති අතර, රටෙහි අනාගත ශ්‍රම බලකායෙහි ගුණාත්මක භාවයටද ධනාත්මකව දායක වනු ඇත. ඉංග්‍රීසි භාෂාවේ සහ තොරතුරු තාක්ෂණයෙහි නිපුණත්වයක් සහිත ජනගහනයක් පැවතීම රට තුළට විදේශ නිෂ්පාදන ආයතන ආකර්ෂණය කොට ඒවාට ක්‍රියාත්මක වීමට උපකාර වනු ඇත.

**උපාධි පාඨමාලාවන්හී කොටසක් ලෙස සරල නිපුණතා දියුණු කිරීම මගින් උපාධිධාරීන්ගේ සේවා නියුක්ති හැකියාව සැලකිය යුතු ලෙස වැඩි දියුණු කෙරෙනු ඇත.** විශ්වවිද්‍යාල වල පවතින උපාධි වැඩසටහන් ප්‍රධාන වශයෙන් ඉලක්ක කොට ඇත්තේ විෂය කරුණු සහ ශිෂ්‍යයන්ගේ තාක්ෂණික කුසලතා කෙරෙහිය. කෙසේ වෙතත් සේවා යෝජකයෝ ප්‍රාරම්භකයන්, පුහුණු කිරීමේ හැකියාව, නම්‍යශීලී භාවය, කණ්ඩායම් හැඟීම, සන්නිවේදනය, ධනාත්මක වැඩ ආකල්ප සහ විනයානුකූල භාවය වැනි ආකල්ප සහ කුසලතා අපේක්ෂා කරති. ශිෂ්‍යයන් අතරේ එවැනි ආකල්ප සහ කුසලතා වර්ධනය කිරීම, උපාධිධාරීන් තුළ සේවා නියුක්ති හැකියාව ඉතා දැඩි ලෙස ඉහළ නංවනු ඇත.

**ශිෂ්‍යයන් හට රැකියා පිළිබඳ අත්දැකීම් ලබා දීම සඳහා සීමාවාසික පුහුණු වැඩසටහන් පුළුල් කිරීම, උසස් අධ්‍යාපන වැඩසටහන්හී අදාළත්වය වැඩි දියුණු කරනු ඇත.** එවැනි සීමාවාසික පුහුණු වැඩසටහන් හී ද්විත්වාකාර වාසි තිබේ. කර්මාන්ත පාර්ශ්වයෙන් ගත් කළ, ඒවා කර්මාන්ත ශාලාව තුළදී සිදුවන පුහුණු කාලය අතරතුරදී ඔවුන්ගේ කාර්මික අවශ්‍යතා සඳහා ශිෂ්‍යයන්ට රැකියාව පිළිබඳ අවධාරණය කිරීමට, පුහුණු කිරීමට සහ ඔවුන් පිළිබඳ තක්සේරු කිරීමට සේවායෝජකයන් හට අවකාශය සලසා දේ. මෙය සුවිශේෂී මානව ප්‍රාග්ධනය ගොඩනගන අතර, පර්යේෂණ සහ වර්ග කිරීමේ පිරිවැය අවම කරයි. ශිෂ්‍යයන්ගේ පාර්ශ්වයෙන් ගත් කල, එය පෞද්ගලික අංශයේ රැකියා ස්ථානයන්හී සංස්කෘතිය සහ ඒවා සඳහා අවශ්‍ය කරන කුසලතා ඉගෙන ගැනීමට අවස්ථාවක් සලසන අතර, පෞද්ගලික අංශයේ සේවා නියුක්තිය සඳහා ආකල්පමය සහ තාක්ෂණික කුසලතා සංවර්ධනය සඳහා ඉඩකඩ සලසා දෙයි.

**වෘත්තීය මාර්ගෝපදේශනයෙහි පෞද්ගලික අංශයේ හවුල්කාරීත්වය ඉහළ නැංවීම මගින් මෙම වැඩ සටහන් වඩා අදාළ බවට පත් කර ගැනීමට හැකි වේ.** පෞද්ගලික අංශයේ නියෝජිතයන්ගේ සහභාගීත්වය වැඩි කිරීම මඟින් විශ්වවිද්‍යාල වෘත්තීය මාර්ගෝපදේශන වැඩසටහන් වැඩි දියුණු වනු ඇත. මෙම නියෝජිතයන් හට පෞද්ගලික අංශය තුළ ඇති වෙතැයි සිතිය හැකි අවස්ථාවන් මෙන්ම එවැනි අවස්ථාවන් මඟින් වාසි සලසා ගැනීමට ශිෂ්‍යයන් හට අවශ්‍ය කරන කුසලතා පිළිබඳව කල් තියා සන්නිවේදනය කිරීමට හැකි වනු ඇත. එවිට ශිෂ්‍යයන් හට එවැනි අවස්ථාවන් සහ කුසලතා සිහි තබාගෙන කුමන ආකාරයේ පාඨමාලා හදාරන්නේදැයි තෝරා ගත හැකි වනු ඇත.

**ශ්‍රී ලංකාව ඉහළ ක්‍රියාකාරීත්වයක් සහිත මධ්‍යම ආදායම් ලබන රටක් බවට පත්වීම සඳහා විද්‍යා, තාක්ෂණ සහ පර්යේෂණ සහ සංවර්ධන යන ක්ෂේත්‍රයන් හී කර්මාන්ත සහ විශ්වවිද්‍යාල අතර සම්බන්ධතා ප්‍රවර්ධනය ඉතා වැදගත් වේ.** මධ්‍යම ආදායම් ලබන රටක් ලෙස ශ්‍රී ලංකාවෙහි ආර්ථික දියුණුව ප්‍රධාන වශයෙන් රඳා පවතිනුයේ සංකීර්ණ බව, ගුණාත්මක බව සහ ඵලදායීතාවය යන අංශයන්හී ඉහළ යන විවිධ මට්ටම් වලදී මෙන්ම, දිගින් දිගටම සිදුවන වැඩිදියුණු කිරීම් සහ නවෝත්පාදන ධාරාව හරහා තාක්ෂණය උකහා ගැනීම, ක්‍රියාත්මක කිරීම සහ භාවිතය මතය. විශ්වවිද්‍යාල සතු පර්යේෂණ කුසලතා සහ හැකියාව, කර්මාන්ත ශාලාවලට තාක්ෂණය උකහා ගැනීමේදී, භාවිතයේදී සහ ඒවාට අනුගත වීමේදී මෙන්ම නවෝත්පාදනයේදී සහ නව දැනුම නිර්මාණයේදී විශේෂ කොටම උපකාර විය හැක. විද්‍යා, තාක්ෂණ සහ පර්යේෂණ සහ සංවර්ධන යන මෙවැනි අංශයන් හී කර්මාන්ත ශාලා සහ විශ්වවිද්‍යාල අතර සම්බන්ධතා ප්‍රවර්ධනය සඳහා වෘත්තීමය ලෙස කළමණාකරණය කරනු ලබන විශ්වවිද්‍යාල ව්‍යාපාරික මධ්‍යස්ථාන, තාක්ෂණික වාණිජකරණ කාර්යයාල සහ තාක්ෂණික තැරැව්කාර වැඩසටහන් හරහා ඉතා විශාල පිටිවහලක් වනු ඇත.

## උසස් අධ්‍යාපන අවශ්‍යතා ජාත්‍යන්තර මට්ටමට ගෙන ඒම සඳහා පාලන රාමුව

**ප්‍රස්ථාරය 2: උසස් අධ්‍යාපනයේ වර්ගීකරණයක්**




*මූලාශ්‍රය:* *Grubb, W.N. (2003), The Roles of Tertiary Colleges and Institutes: Trade-offs in Restructuring Postsecondary Education, Paris.*

**පාලනය, ලොව පුරා ව්‍යාප්ත වී ඇති උසස් අධ්‍යාපන ක්‍රම තුළ ඇති ඉතා ව්‍යාකූලම ක්ෂේත්‍රයකි.** මෙයට හේතුවී ඇත්තේ උසස් අධ්‍යාපන ආයතනයන්හී ඒවායේ සිරස් සහ තිරස් සම්බන්ධතා සමඟින් (2 වන ප්‍රස්ථාරය) ඉතා විශාල ලෙස විවිධත්වයකින් යුතු වීමයි. ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපන අංශය තුළ මෙම වර්ගයේ ආයතන බොහෝමයක් ඇති නමුත් සමස්ත අංශය හට වඩා අනුරූපතාවයක් සහ අභ්‍යන්තර ස්ථාවරභාවයක් අවශ්‍ය කරයි. උසස් අධ්‍යාපන අංශයේ පාලනය පිළිබඳව වන ප්‍රධාන විවාදය නම් එක් එක් ආයතන අත්විඳිය යුතු ස්වාධීනත්වයේ ප්‍රමාණය, මෙම ස්වාධීනත්වයත් සමඟ එකට එක්වන වගකීම් දැරීමේ ක්‍රම පිළිබඳවයි. සාමාන්‍ය ගෝලීය ප්‍රවණතාවය නම් වඩා යහපත් ක්‍රියාකාරීත්වයක් සඳහා හේතුවන බවට සලකනු ලබන වඩා පුළුල් ස්වාධීනත්වයක් සඳහා වැඩි ඉඩකඩ ලබා දීමයි.

**ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපන අංශයේ ආයතනික ව්‍යුහය, උසස් අධ්‍යාපන ආයතන සඳහා පුළුල් ස්වාධීනත්වයක් සහ බලගැන්වීමක් සහිත ආයතන බවට පත් කරන, මධ්‍යගත ඉහළ සිට පහළට තීරණ ගන්නා ආකෘතියක්** (top – down model) **සහ විමධ්‍යගත ආකෘතියක් අතර තුලනය වේ.** උසස් අධ්‍යාපන අංශය තුළ ස්වාධීනත්වයේ සහ වගකීමෙහි මට්ටම් සැලකිය යුතු ලෙස විවිධ වේ. ශ්‍රී ලංකා උසස් තාක්ෂණවේදී අධ්‍යාපන ආයතන ක්‍රමය ඉතාමත් සංකේන්ද්‍රීය වූ සරල බලය ලත් කුඩා කණ්ඩායමක් විසින් තීරණ ගනු ලැබූ ආකෘතියකි. අධ්‍යයන කාර්ය මණ්ඩලය බඳවා ගැනීම, විෂය නිර්දේශ සංවර්ධනය සහ ඉගැන්වීම් සහ පර්යේෂණ ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් රජයේ විශ්වවිද්‍යාල ශ්‍රී ලංකා උසස් තාක්ෂණවේදී අධ්‍යාපන ආයතන වලට වඩා වැඩි ස්වාධීනත්වයක් භුක්ති විඳීමයි. කෙසේ වෙතත්, සංවර්ධිත සහ මධ්‍යම ආදායම් ලබන රටවල ස්වාධීන වන රජයේ විශ්වවිද්‍යාල වල ඇති වෙනත් බොහෝ අංගයන් ශ්‍රී ලංකාවේදී සංකේන්ද්‍රණය වී තිබේ. පෞද්ගලික උසස් අධ්‍යාපන ආයතන ලාභ නොඉපයන ආයතන සඳහා ආයතනික බලතල යටතේද, ලාභ උපයන ආයතන සඳහා වෙළෙඳපොළ බලවේග යටතේද ප්‍රධාන වශයෙන් ක්‍රියාත්මක වන අතර, රජයෙන් පූර්ණ වශයෙන්ම පාහේ නිදහස් ව පවතී.

### *අභියෝග*

**උසස් අධ්‍යාපනයේ පවතින විවිධ වර්ග සහ මට්ටම් අතර ඇති ප්‍රවේශ සහ සංචලනය ඉතා සීමා සහිත වේ.** පළමු ප්‍රස්ථාරයේ දක්වා ඇති පරිදි, වර්ගීකරණයට අනුව ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපන අංශය සතුව ඉතා පුළුල් පරාසයක පැතිරී පවත්නා විවිධත්වයෙන් යුතු ආයතන රාශියක් තිබෙන අතර එය ද්විත්ව ක්‍රමයක සිට ත්‍රි පාර්ශ්වීය ක්‍රමයක් බවට පත්වනු දැකිය හැකි වේ. කෙසේ වෙතත්, අධ්‍යාපනය, පුහුණුව සහ වෘත්තීමය මාර්ග වෙත ප්‍රවේශයක් මෙන්ම ඒවා අතර සංචලනය සහ ප්‍රගතිය සලසා දෙන පැහැදිලි ඉගෙනුම් මාර්ග ඉතාමත් හිඟ වේ. රැකියාවක් සඳහා වන අධ්‍යාපනයක - එනම් එක්තරා රැකියාවක් කිරීම සඳහා අවශ්‍ය කරන හැකියාවක් වර්ධනය කිරීමේ සිට රැකියාවක නියුතු වීමේ හැකියාව සඳහා වන අධ්‍යාපනයක් එනම්, නව

රැකියා පරිසර සඳහා අවශ්‍ය කරන කුසලතා වලට අනුගත වීමේ හැකියාව වර්ධනය වීමක් දක්වා නූතන චින්තනය මාරු වී ඇති බවට වන උපකල්පනය මත, එවැනි මාර්ගයන්හී හිඟකම මඟින් අනුගත විය හැකි සහ තාක්ෂණික වශයෙන් කුසලතා සහිත ශ්‍රම බලකායක සංවර්ධනය අඩාල කරයි.

**ශාස්ත්‍රඥයන් සහ විශ්වවිද්‍යාල කාර්යමණ්ඩලය සමඟ පවත්වන ලද සාකච්ඡා අධික මධ්‍යම පාලන අධිකාරීත්වයට බොහෝ අවස්ථාවන්වලදී නිසි ක්‍රියාකාරීත්වය සඳහා බාධාවන් ඇති කළ හැකි බව පෙන්වා දෙනු ලැබේ.** උසස් අධ්‍යාපන අමාත්‍යංශය සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව ඒවාට ගැනීමට අවශ්‍ය කරන ඉතා විශාල සංඛ්‍යාවක් මෙහෙයුම් තීරණ හේතුවෙන් ඇති වී ඇති අනවශ්‍ය පරිපාලනමය වැඩ කටයුතු ගොන්නකට මුහුණ දී සිටින අතර, මේ හේතුවෙන් ඉහළ මට්ටමේ ප්‍රතිපත්තිමය කරුණු සඳහා යෙදවීමට ඇති කාලය සහ අවධානය සීමා වේ. මධ්‍යම පාලනය සඳහා සහ අනුමැති ලබා ගැනීමේ අවශ්‍යතා හේතුවෙන් විශ්වවිද්‍යාලයන්හී ව්‍යවසායකත්වවාදය සහ මුල පිරීම් අවම වී ඇත. කේන්ද්‍රීය ආයතන තීරණ ගන්නා විට ප්‍රමාද වීම් ද ක්‍රමයෙන් වැඩි විය හැක. තවද, මෙම ක්‍රමය තුළ පවත්නා මධ්‍යගත වූ අංගයන් මඟින් ඇති කරන ලද දීර්ඝ පරිපාලන දාමයන් හී ප්‍රතිඵලයක් ලෙස, පුද්ගල අධිකාරීත්වය සහ අවිධිමත් සම්බන්ධතා වලට, ක්‍රියාපටිපාටිමය කාර්යක්ෂමතාවය අඩාල කරමින් ක්‍රියාත්මක විය හැකි වේ.

**විශ්වවිද්‍යාලයන් හී පාලන පදනම් වී ඇත්තේ පැරණි පොදු රාජ්‍ය මණ්ඩලීය ආකෘතියක් මත වන නමුත් වර්තමානයේදී මෙම ආකෘතියෙහි ඇතුළත් නූතන වර්ධනයන් මඟ හැරී ඇත.** උදාහරණයක් වශයෙන්, එක්සත් රාජධානිය, ඕස්ට්‍රේලියාව සහ කැනඩාව වැනි පොදු රාජ්‍ය මණ්ඩලීය රටවල වඩා දියුණු උසස් අධ්‍යාපන ක්‍රම මෙන් නොව, රජයේ විශ්වවිද්‍යාල සඳහා සම්මත අරමුදල් සම්පාදන ක්‍රමයක් නොමැත. ඒ වෙනුවට ශ්‍රී ලංකාවේ එක් එක් විශ්වවිද්‍යාල අතර පුනරාවර්තන අරමුදල් විශාල වශයෙන් පදනම් වනුයේ ඓතිහාසිකමය ස්තර මත වන අතර, ප්‍රාග්ධන අරමුදල් ප්‍රධාන වශයෙන් පදනම් වනුයේ තනි ආයතන, උසස් අධ්‍යාපන අමාත්‍යංශය/ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යංශය අතර සාකච්ඡා මතය. උසස් අධ්‍යාපන ආයතනයන්හී ආයතනික රාමුව පොදුවේ වඩා දියුණු උසස් අධ්‍යාපන ක්‍රම වලට වඩා කේන්ද්‍රීය අධිකාරීන්ගේ අති විශාල මැදිහත් වීම මඟින් හඳුනා ගනු ලැබේ. මෙහි ප්‍රතිඵලයක් ලෙස, විශ්ව විද්‍යාලයන්හී වර්තමාන කළමණාකරණ සහ පරිපාලනමය හැකියාව සාපේක්ෂ වශයෙන් අන් ඒවා හා සැසඳීමේදී ඌන සංවර්ධිතය. මෙය විශේෂ කොටම දැකිය හැකි වනුයේ වඩා අළුත්, මෑතකදී පිහිටවනු ලැබූ විශ්ව විද්‍යාල සහ විශේෂයෙන්ම උතුරු සහ නැගෙනහිර පළාත් ඇතුලු සංවර්ධනය අඩාල ප්‍රදේශවල ඇති විශ්ව විද්‍යාල සම්බන්ධයෙනි.

**තත්ත්ව ආරක්ෂණ යාන්ත්‍රණ පටු ආවරණයක් සහිත වන අතර, සැලකිය යුතු ප්‍රමාණයකින් එය පුළුල් කළ යුතු වේ.** විකල්ප උසස් අධ්‍යාපන අංශය, පෞද්ගලික උසස් අධ්‍යාපන අංශය සහ බාහිර උපාධි වැඩසටහන් සඳහා තත්ත්ව ආරක්ෂණ යාන්ත්‍රණ වල හිඟකමක් රටෙහි දක්නට ඇත. රජයේ විශ්ව විද්‍යාල තුළ තත්ත්ව ආරක්ෂණ යාන්ත්‍රණ ආරම්භ කරමින් පවතින්නේ පශ්චාත් උපාධි අධ්‍යාපන වැඩසටහන් පමණක් වන අතර ඒ සඳහා ප්‍රමාණාත්මක අනාගත සංවර්ධනයක් අවශ්‍ය කරනු ඇත. උපාධි අපේක්ෂක මට්ටමේදී තත්ත්ව ආරක්ෂණ ක්‍රියාවලීන් ඉතා මෑත කාලයේදී හඳුන්වා දෙනු ලැබූ මුත් මේවා වර්තමානයේදී විශ්වවිද්‍යාල පද්ධතියේ පූර්ණ කොටසක් බවට පත්වීමට සංවර්ධිත වීම සහ ශක්තිමත් වීම අවශ්‍ය කෙරේ.

## ක්‍රමෝපායික සංවර්ධන විකල්ප

උසස් අධ්‍යාපන අංශයේ පාලනය නව්‍යකරණය කිරීම සඳහා ප්‍රාරම්භක සහ ප්‍රතිසංස්කරණ රාශියක් ඇත.

**උසස් අධ්‍යාපන අංශයේ පාලන රාමුව ශක්තිමත් කිරීම සඳහා ජාතික සුදුසුකම් රාමුවක වර්ධනය ඉහළ ප්‍රමුඛතාවයක් ගනී.** මෙම රාමුව විශ්වවිද්‍යාල. විකල්ප උසස් අධ්‍යාපන ආයතන සහ දුරස්ථ අධ්‍යාපන සහ බාහිර උපාධි (ජාතික සුදුසුකම් රාමු සඳහා ජාත්‍යන්තරව දැකිය හැකි නිදර්ශන කිහිපයක් සඳහා පළමු සටහන බලන්න) ආවරණය කළ යුතු වේ. එය විවිධ වර්ගයේ ආයතන තුළ ප්‍රවේශය සහ සංචලනය, පුද්ගලයන්ගේ වෘත්තීය මාර්ග සමඟ එකිනෙක සම්බන්ධ කරනු ඇති අතර එබැවින් පුද්ගලයන් හට කුසලතා උකහා ගැනීමට ඔවුන්ට ඇති අවශ්‍යතාවයන් සහ තිරස් සහ සිරස් රැකියා සංචලතාව මත පදනම් වෙමින් උසස් අධ්‍යාපන අංශය සහ ඔවුන්ගේ රැකියා ජීවිත අතර නම්‍යශීලීව සංචලනය විය හැකි වේ.

**උසස් තාක්ෂණික ආයතන (ATIS) දැඩි ලෙස බලාත්මක කරමින් ඉතා දැඩි මධ්‍යගත වූ ශ්‍රී ලංකා උසස් තාක්ෂණවේදී අධ්‍යාපන ආයතන රාමුව සැහැල්ලු කළ යුතු වේ.** විශේෂයෙන්ම, විෂය නිර්දේශ සවර්ධනය, ඇගයීම සහ විභාග වැනි අධ්‍යාපන ක්‍රියාකාරකම් සඳහා මෙම උසස් තාක්ෂණික ආයතන වලට වැඩි ස්වාධීනත්වයක් සහ වගකීමක් තිබිය යුතු වේ. ශ්‍රී ලංකා උසස් තාක්ෂණවේදී අධ්‍යාපන ආයතනයෙහි ප්‍රධාන කාර්යාලය, සැලසුම්කරණය, අධි තාක්ෂණය විශ්ලේෂණය සහ ප්‍රතිපත්ති සංවර්ධනය සම්බන්ධයෙන් ඉහළ පෙළේ ආයතනයක් බවට පත්විය යුතුය. ශ්‍රී ලංකා උසස් තාක්ෂණවේදී අධ්‍යාපන ආයතනයෙහි ප්‍රධාන කාර්යාලයේ සහ උසස් තාක්ෂණික ආයතනයන් හී එවැනි වෙනස්කම්, මෙම නියෝජිත ආයතන වලට තමන් වෙත පැවරී ඇති

**සටහන 1: ජාතික සුදුසුකම් රාමු සඳහා ජාත්‍යන්තර නිදර්ශන**

**ඕස්ට්‍රේලියානු සුදුසුකම් රාමුව (AQF)**
ඕස්ට්‍රේලියානු සුදුසුකම් රාමුව සතුව පහත සඳහන් අරමුණු ඇත.

උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන සහ පුහුණු ක්‍රම විසින් නිකුත් කරන ලද සුදුසුකම් තනි පුළුල් නාම සහ තත්ත්ව පද්ධතියක් වෙත ගෙන ඒම.

අංශ සහ දිගුකාලීන ඉගෙනුම් අතර නම්‍යශීලී අධ්‍යාපනය සහ පුහුණු කිරීම් මාර්ග සඳහා උපකාර කිරීම.

ශාස්ත්‍රීය සහ පුහුණු සුදුසුකම් අතර ඇති පිළිගැනීම සමාන ලෙස දැක්වීමට දිරිමත් කිරීම.

අධ්‍යාපන සහ පුහුණු අංශයන්හී සේවා සපයන්නන්ගේ අරමුණුවල විවිධත්වය සඳහා සහයෝගය දැක්වීම

තත්ත්ව ආරක්ෂණය, සන්ධානය සහ පාඨමාලා ඒකක හුවමාරුවපිළිබඳ ජාතික ප්‍රතිපත්තිවලට සම්බන්ධ වීම්.

**සුදුසුකම් පිළිබඳ අයර්ලන්ත ජාතික රාමුව (INFQ)**
සුදුසුකම් පිළිබඳ අයර්ලන්ත ජාතික රාමුව මූලික සහතික පත්‍ර මට්ටමෙ සිට ආචාර්ය උපාධිය දක්වා ස්තර දහයකින් සැදුම්ලත සැකැස්මකි.

මෙම ස්තර නිර්වචනය කරනු ලැබ ඇත්තේ ඉගෙනුම් ප්‍රතිඵලයිහී පුළුල් විස්තරයක් වන “ස්තර දර්ශක” මඟිනි.

“ප්‍රදානයන් වර්ග” පිළිබඳ නිර්වචනය, පදනම් වී ඇත්තේ නම් කරන ලද ප්‍රදානයන්ගේ පන්තීන් පොදු ගුණාංග සහ මට්ටම් වලට අයත් වන බැවින් එක්තරා දර්ශයක මතය.

සුදුසුකම් පිළිබඳ අයර්ලන්ත ජාතික රාමුව පාඨමාලා ඒකක මත පදනම් වූවක් නොවේ. කෙසේ වෙතත් යුරෝපීය පාඨමාලා ඒකක හුවමාරු ක්‍රමය (ECTS) සහ වෘත්තීය අධ්‍යාපනය සහ පුහුණුව සඳහා යුරෝපීය පාඨමාලා ඒකක (EVC-ET) සැලකිල්ලට ගනිමින් පාඨමාලා ඒකක  කළමනාකරණ ක්‍රියාවලියක් ගොඩ නැඟෙමින් පවතී.

නව කාර්ය භාරය ඵලදායී අයුරින් ඉටු කිරීමට කාර්ය මණ්ඩලය සංවර්ධනය සඳහා ස්වාධීනත්වයක් සහ වගකීමක් තිබිය යුතු වේ. ශ්‍රී ලංකා උසස් තාක්ෂණවේදී අධ්‍යාපන ආයතනයෙහි ප්‍රධාන කාර්යාලයේ සහ උසස් තාක්ෂණික ආයතනයන්හී එවැනි වෙනස්කම් මෙම නියෝජිත ආයතන වලට තමන් වෙත පැවරී ඇති නව කාර්ය භාරය ඵලදායී අයුරින් ඉටු කිරීමට කාර්ය මණ්ඩල සංවර්ධනය, සංවිධානය ශක්තිමත් කිරීම සහ හැකියාව වැඩිදියුණු කිරීම මඟින් ඉදිරියට ගෙන යා යුතු වේ.

**ශ්‍රී ලංකා උසස් තාක්ෂණවේදී අධ්‍යාපන ආයතනයෙහි ගුණාත්මක තත්ත්වය ඉහළ නැංවීම ඉතා ඉහළ ප්‍රමුඛතාවයක් ගනී.** විකල්ප උසස් අධ්‍යාපන අංශය වෙත විශ්ව විද්‍යාල අංශයට වඩා අඩු ප්‍රතිපත්තිමය අවධානයක් යොමුව ඇති අතර, සාපේක්ෂ වශයෙන් එය ඌන සංවර්ධිතයි. ශ්‍රී ලංකා උසස් තාක්ෂණවේදී අධ්‍යාපන ආයතනය  ශක්තිමත් කිරීම සඳහා අනාගතයේදී සැලකිය යුතු මට්ටමේ ආයතනික සංවර්ධනයක් අවශ්‍ය කෙරේ. කේන්ද්‍රීය මට්ටමේදී, ඉගෙනුම නවෝත්පාදකයන් සහ වැඩ පාදක ඉගැන්වීම් සහ ඇගයීම් ක්‍රමවේද සමඟින් ගුරු මණ්ඩලයට උපකාර කරන ප්‍රතිපත්තියක් සමඟින් ශ්‍රී ලංකා උසස් තාක්ෂණවේදී අධ්‍යාපන ආයතනය සඳහා අධ්‍යයන කාර්ය මණ්ඩල නායකත්ව ආයතනයක්  පිහිට විය යුතු වේ. පෞද්ගලික අංශය ද විෂය නිර්දේශ, විභාග සහ ඇගයුම් ක්‍රමවේද සැකසීමේදී දායක විය යුතු වේ. මේ අනුව, පෞද්ගලික අංශයේ සහ සේවායෝජක හවුල් හී නියෝජිතයන් ද සමඟින් වැඩසටහන් උපදේශක කමිටු ශ්‍රම වෙළෙඳ පොළෙ හි අවශ්‍යතා වලට වඩා හොඳින් දායක වීම සඳහා ශ්‍රී ලංකා උසස් තාක්ෂණවේදී අධ්‍යාපන ආයතන වලට උපකාර කිරීම ඉතාමත් ප්‍රයෝජනවත් වනු ඇත.

**විශ්වවිද්‍යාල වලට ඉතා විශාල ලෙස බලය බෙදා හැරීම පැති කිහිපයකින් සලකා බැලිය හැකි කරුණක් වේ.** මීට, අධ්‍යයන කාර්ය මණ්ඩලය උසස් කිරීම, විශේෂ වශයෙන්ම ගුරුවරුන් හිඟ විෂයයන් සඳහා අධ්‍යයන කාර්ය මණ්ඩල වැටුප් ඉහළ දැමීම, අනධ්‍යයන කාර්ය මණ්ඩල බඳවා ගැනීම්, නව අධ්‍යයන පාඨමාලා සංවර්ධනය, සම්මත අයවැයක් තුළ නව අධ්‍යයන තනතුරු ඇති කිරීම සහ ආයතනයන්හී පාලන රාමුව සම්බන්ධ තීරණ ඇතුළත් වේ. බලය බෙදා හැරීම සාර්ථක වීමට නම්, ප්‍රථමයෙන්ම, පැහැදිලි වගකීම් සහගත යාන්ත්‍රණ ස්ථාපනය කිරීම අත්‍යවශ්‍ය වේ. දෙවනුව, විශ්ව විද්‍යාල වෙත ඉතා විශාල වගකීම් සම්භාරයක් පවරා දෙනු ලබන්නේ නම්, විශ්ව විද්‍යාල නායකත්වය සහ පරිපාලනය තුළ කළමණාකාරීත්ව හැකියාව ගොඩනැංවීම අවශ්‍ය කෙරේ.

**සමස්ත උසස් අධ්‍යාපන අංශය සඳහාම තත්ත්ව ආරක්ෂණ ක්‍රමයක් ස්ථාපනය කිරීම ඉතා වැදගත් වේ.** රටට, විකල්ප උසස් අධ්‍යාපන අංශයේ, පශ්චාත් උපාධි අධ්‍යාපනයේ, ප්‍රථම උපාධි අධ්‍යාපනයේ, දුරස්ථ අධ්‍යාපනයේ මෙන්ම පෞද්ගලික උසස් අධ්‍යාපන අංශයේ ද වැඩසටහන් සහ පාඨමාලා ආවරණය කරන තත්ත්ව ආරක්ෂණ ක්‍රම අවශ්‍ය කර තිබේ. ජාත්‍යන්තරයන්හී පළපුරුද්ද අනුව පෙන්වා දෙන කරුණක් නම් තත්ත්ව ආරක්ෂණය සහ බලය පැවරීම පිළිබඳ ආකෘති ගණනාවක් ඇති බවයි.

මෙම වාර්තාව ලංකාවට ආදර්ශයට ගත හැකි (දෙවන සටහන) රටවල් කිහිපයක ආකෘතීන් පිළිබඳ සාකච්ඡා කරයි. කුමන ආකෘතියක් තෝරා ගත්තද, රජයේ සහ පෞද්ගලික අංශයේ උසස් අධ්‍යාපන ආයතන සඳහා තත්ත්ව ආරක්ෂණ නියෝජිත ආයතන (හෝ ආයතනය) මඟින් පොදු ප්‍රමිති සහ නිර්ණායක සහ ඒ හා සමාන ක්‍රියාවලීන් අදාළ කර ගනු ලැබීම වැදගත් වේ.

**සටහන 2: තත්ත්ව ආරක්ෂණය සඳහා ජාත්‍යන්තර ආකෘති**

- **ඇ.එ.ජ.:** සාමාජික උසස් අධ්‍යාපන ආයතන 3,600ක් විසින් පවත්වා ගෙන යනු ලබන ස්වාධීන සංවිධානයක් (උසස් අධ්‍යාපන බලය පැවරීම සඳහා වන කවුන්සලය)
- **දකුණු අප්‍රිකාව:** උසස් අධ්‍යාපනයෙහි ගුණාත්මක භාවය (HEQC) පිළිබඳ අමාත්‍යවරයාට උපදෙස් සැපයීමේ භූමිකාවක් සහිත අධ්‍යාපන ඇමැතිවරයාගේ ස්වාධීන ව්‍යවස්ථානුකූල උපදේශක කවුන්සලයක උප කමිටුවක්.
- **මැලේසියාව:** උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ තත්ත්ව ආරක්ෂණ අංශයක්.
- **නවසීලන්තය:** උප කුලපතිවරුන්ගේ කමිටුව මඟින් පිහිටවා ගත් ස්වාධීන ආයතනයක්.
- **එක්සත් රාජධානිය, ඕස්ට්‍රේලියාව, තායිලන්තය:** තම ස්වාධීන පාර්ලිමේන්තු පනතක් හෝ ප්‍රඥප්තියක් සහිත ස්වාධීන සංවිධානයක්.

## උසස් අධ්‍යාපන ළඟා කර ගැනීම් සහ ව්‍යාප්තියේ රාමුවෙහි පරිවර්තනයක් සිදු වීම අවශ්‍ය කෙරේ.

**ශ්‍රී ලංකාව උසස් අධ්‍යාපනය සඳහා යොමුවන්නන් පහළ මට්ටමක සිටින රටක් ලෙස ඇති දැකීම සත්‍ය නොවේ.** සමහරක් ප්‍රසිද්ධ සංඛ්‍යා ලේඛන වලට අනුව ශ්‍රී ලංකාවෙහි දළ උසස් අධ්‍යාපනය සඳහා ලියාපදිංචි වීමේ අනුපාතය (GER) සියයට 5 නොඉක්මවයි. නමුත් මෙම සංඛ්‍යාව දළ අවතක්සේරුවක් ලෙස පෙනේ. මන්ද, එයට බාහිර උපාධි වැඩසටහන් සහ පෞද්ගලික අංශයේ උසස් අධ්‍යාපන ආයතන හී ලියාපදිංචි වූ සිසුන් ගණන් නොගන්නා බැවිනි. මෙම ශිෂ්‍යයන්ද සැලකිල්ලට ගත්තේ නම්, එම දළ උසස් අධ්‍යාපනය සඳහා ලියාපදිංචි වීමේ අනුපාතය සියයට 21 කට පමණ ළඟා වනු ඇති අතර, එය සැලකිය යුතු මට්ටමේ ධනවත් රටවල් ලෙස හඳුන්වනු ලබන බ්‍රසීලය, එල් සැල්වදෝරය සහ ජැමෙයිකාව සමඟ ශ්‍රී ලංකාව සමාන වනු ඇත. කෙසේ වෙතත්, බාහිර උපාධි වැඩසටහන් සඳහා ලියාපදිංචි වී සිටින සියලු සිසුන් සක්‍රීයව උසස් අධ්‍යාපනයෙහි නිරත නොවන බැවින් මෙම සංඛ්‍යා ලේඛණද සංශෝධනය කිරීම අවශ්‍ය වේ. මෙය සිදු කළ විට, උසස් අධ්‍යාපනය සඳහා ලියාපදිංචි වීමේ දළ අනුපාතය ඉන්දියාව සහ මොරොක්කෝවේ අනුපාතිකයන් හා සමාන අගයක් දරමින් සියයට 10-12 අතර වනු ඇත.

### *අභියෝග*

**ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපනය සඳහා ලියාපදිංචි වීමේ ව්‍යුහයෙහි සහ සංයුතියෙහි බහුවිධ ඌනතා දැකිය හැකි වේ.** ප්‍රථමයෙන්, සියයට 60කට ආසන්න ලියාපදිංචි වීම් හී වැඩිම ප්‍රමාණයක් සමන්විත වනුයේ විශ්ව විද්‍යාලයන්හී ලියාපදිංචි වී විභාග සඳහා පෙනී සිටින නමුත් දේශන හෝ පන්ති වලට සහභාගී නොවන මෙන්ම විශ්ව විද්‍යාලයෙන් කිසිදු අධ්‍යයන උපකාරයක් නොලබන සිසුන් සහිත බාහිර උපාධි වැඩසටහන් වලිනි. මෙය උසස් අධ්‍යාපන ප්‍රවේශයන් සහ ව්‍යාප්තිය පුළුල් කිරීම සඳහා රජය සතු අඩු පිරිවැය විකල්පයක් වූ නමුදු එය ගුණාත්මක භාවය අතින් එතරම් හිතකර වූවක් නොවේ. රැකියා විරහිත උපාධිධාරීන්ගෙන් වැඩිම ප්‍රමාණයක් මෙම බාහිර උපාධි වැඩසටහන් වලින් බිහි වූවෝ වෙති.

දෙවනුව, රාජ්‍ය සහ පෞද්ගලික අංශ අතර ලියාපදිංචි වීම් හී වෙනස, සියයට 12ක පමණක් වූ ලියාපදිංචි වීම් ප්‍රමාණයක් සහිත පෞද්ගලික අංශයට එරෙහි වැඩි නැඹුරුවක් දක්වමිනි. මෙයට හේතු වී ඇත්තේ ශ්‍රී ලංකාවේ ශක්තිමත් රාජ්‍ය කේන්ද්‍රීය උසස් අධ්‍යාපන ක්‍රමයයි. කෙසේ වෙතත්, එය ශ්‍රී ලංකාවේ අභ්‍යන්තර උසස් අධ්‍යාපන වැඩසටහන් සඳහා ලියාපදිංචි වීම් සියලු ලියාපදිංචි වීම් වලින් සියයට 40ක් දක්වා අඩු කිරීමට සහ ඉතිරි සියයට 60 බාහිර උපාධි වැඩ සටහන් මඟින් සම්පූර්ණ කිරීමට බල කරයි. මෙය, ඉහතදී සාකච්ඡා කළ පරිදි උසස් අධ්‍යාපන අංශයේ සමස්ත ගුණාත්මක භාවය පහළ හෙළයි. තවද, එය උසස් අධ්‍යාපනය සඳහා ප්‍රවේශය සහ එහි ව්‍යාප්තිය පුළුල් කිරීමට පෞද්ගලික අංශයට දායක වීමේ හැකියාව අනාවරණය කර ගැනීමෙන් ශ්‍රී ලංකාව වළකාලයි.

තෙවනුව, රැකියා පාදක කරගත් පෞද්ගලික අංශයේ විකල්ප උසස් අධ්‍යාපන ආයතන සඳහා ලියාපදිංචි වනුයේ අඩු සංඛ්‍යාවකි. මෙය ගෝලීය උසස් අධ්‍යාපන ව්‍යාප්තියේ වැදගත් මෙන්ම වර්ධනය වන උප අංශයකි. එහෙත්, ශ්‍රී ලංකාවේ දී මෙම ඉතා වැදගත් උප අංශයෙහි හැකියාව නිසි පරිදි ප්‍රයෝජනයට නොගනී. සමස්ත උසස් අධ්‍යාපනය සඳහා වන ලියාපදිංචි වීම් වලින් සියයට 3ක් පමණක් වෙමින් ශ්‍රී ලංකා උසස් තාක්ෂණවේදී අධ්‍යාපන ආයතනයෙහි ලියාපදිංචි වීම් තවමත් අඩු මට්ටමක පවතී.

සිව්වෙනුව, විශ්ව විද්‍යාලයන් හී සාම්ප්‍රදායානුකූල උපාධි පාඨමාලාවන් හී ශිෂ්‍ය සංයුතිය තවමත් අත්පත් කර ගනු ලැබ ඇත්තේ විද්‍යා සහ තාක්ෂණික ක්ෂේත්‍රයන් කෙරෙහි අඩු නියෝජනයක් සහිතව කලා, කළමණාකරණ, වාණිජ සහ නීතිය වැනි ක්ෂේත්‍රයන්

මඟිනි. වේගයෙන් දියුණු වීමට නම්, මැදි ආදායම් උපයන රටකට කුසලතා සහිත සහ නිපුණතා හෙබි විද්‍යා සහ තාක්ෂණ උපාධිධාරීන් විශාල ප්‍රමාණයක් අවශ්‍ය කෙරේ.

## ක්‍රමෝපායික සංවර්ධන විකල්ප

**රට සංවර්ධනය වන විට, උසස් අධ්‍යාපනය සඳහා වන ඉල්ලුම ඉහළ යනු ඇති අතර, ශ්‍රී ලංකාවට උසස් අධ්‍යාපන ක්‍රමය තුළ ඉඩ ප්‍රස්ථා සැලසීමේ මාර්ග පුළුල් කළ හැකි ක්‍රම සොයා ගැනීමට සිදුවනු ඇත.** මෙමගින් උසස් අධ්‍යාපන අංශයේ සැකැස්ම සහ සංයුතිය ශක්තිමත් කිරීම සඳහා විශිෂ්ට අවස්ථාවක් සලසා දෙනු ඇත. මෙම අරමුණ ළඟා කර ගැනීම සඳහා රජය වෙත ඇති ප්‍රතිපත්තිමය ප්‍රාරම්භකයන් කිහිපයක් වේ.

**ශ්‍රී ලංකා උසස් තාක්ෂණවේදී අධ්‍යාපන ආයතනය මඟින් පවත්වනු ලබන පාඨමාලා වැනි රැකියා අරමුණු කොට ගත් විකල්ප උසස් අධ්‍යාපන වැඩසටහන් සඳහා ලියාපදිංචි වීම කාලයත් සමඟ පුළුල් කළ යුතු වේ.** විකල්ප උසස් අධ්‍යාපන අංශයේ පාඨමාලා සෘජුව රැකියා අරමුණු කොට ගත් ඒවා වන අතර, වෙළෙඳපොළ වෙත ප්‍රධාන ප්‍රවේශයක් වේ. තවද, මෙම ආයතන සාමාන්‍යයෙන් වඩා නම්‍යශීලී වන අතර, සාම්ප්‍රදායික විශ්ව විද්‍යාලවලට වඩා වැඩි වේගයකින් වෙනස් වන ශ්‍රම වෙළෙඳපොළ අවශ්‍යතාවයන්ට ප්‍රතිචාර දැක්විය හැක. විශ්වවිද්‍යාල වලට වඩා අඩු ඒකක පිරිවැයක් මෙම ආයතනවල දැකිය හැකි බැවින් ලියාපදිංචි වීම් පුළුල් කිරීම සඳහා රජයට දැරිය යුතු වන්නේ අඩු වියදමකි.

**උසස් අධ්‍යාපන ආයතනයන් හී අභ්‍යන්තර උපාධි වැඩසටහන් සඳහා ලියාපදිංචි වීමේ ප්‍රමාණය ඉහළ යා යුතු අතර, කාලයත් සමඟ අඩු ගුණාත්මක බවින් යුතු බාහිර උපාධි වැඩසටහන් සඳහා ලියාපදිංචි වීමේ ප්‍රමාණය අඩු කළ යුතු වේ.** බාහිර උපාධි වැඩසටහන් සඳහා ඉහළ මට්ටමේ ගුණාත්මක අධ්‍යාපනයක් ලබා දීමට විශ්වවිද්‍යාලවලට ඇති හැකියාව සමඟ බද්ධ වී ඇති, දැඩි ඇතුළත් කර ගැනීමේ සහ ප්‍රගතිය පිළිබඳ නිර්ණායක සහිතව, බාහිර උපාධි වැඩසටහන් සඳහා ලියාපදිංචි කර ගැනීම ඉතා සැලකිල්ලෙන් යුතුව පාලනය කිරීම අවශ්‍ය වේ. අභ්‍යන්තර උපාධි පාඨමාලා පුළුල් වීමත් සමඟ මේවා බාහිර උපාධි වැඩසටහන් සඳහා අර්ධ වශයෙන් ආදේශ කළ යුතු වේ. ඊට අමතරව ශ්‍රී ලංකා උසස් තාක්ෂණවේදී අධ්‍යාපන ආයතනය, උසස් තාක්ෂණික ආයතනයන් හී ලියාපදිංචි වීම, ව්‍යාප්ත වීම, උසස් තාක්ෂණික ආයතන සම්බන්ධයෙන් බාහිර උපාධි වැඩසටහන් ආදේශ කිරීමට ඉඩ සළසනු ඇත.

**පෞද්ගලික අංශයේ උසස් අධ්‍යාපනය වර්ධනයට සහ ව්‍යාප්ත කිරීම සඳහා දිරිමත් කිරීම අවශ්‍ය වේ.** ආසියාවේ සහ නැගෙනහිර යුරෝපයේ පෙරදී පැවති කොමියුනිස්ට් රටවල් මෙන්ම ඉන්දියාව, පාකිස්ථානය සහ බංග්ලාදේශය වැනි බොහෝ දකුණු ආසියාතික රටවල් ද ඇතුලුව, ලොව පුරා පිහිටි රටවල් උසස් අධ්‍යාපනය සඳහා ප්‍රවේශය සහ එහි ව්‍යාප්තිය ඉහළ දැමීම සඳහා පෞද්ගලික අංශයේ වර්ධනය සඳහා දායක වීම සහ දිරිමත් කිරීම සිදු වේ. (තෙවන සටහන) පෞද්ගලික උසස් අධ්‍යාපන ආයතන ප්‍රධාන වශයෙන්ම රැකියා අරමුණු කරගත් වැඩසටහන් සහ පාඨමාලා පිරිනමන අතර, උපාධිධාරීහු වඩා පහසුවෙන් රැකියා සොයා ගනිති. මේවා තමන් විසින්ම මුදල් සම්පාදනය කරගන්නා බැවින්, පෞද්ගලික අංශයේ උසස් අධ්‍යාපනයෙහි ව්‍යාප්තිය සඳහා රජය එතරම් පිරිවැයක් නොදරයි.

### සටහන 3: රුසියාවේ සහ චීනයේ පෞද්ගලික උසස් අධ්‍යාපනය

**රුසියාව :** අධ්‍යාපනය පිළිබඳ වූ රුසියානු සමූහාණ්ඩු නීතියෙහි ප්‍රතිඵලයක් ලෙස ප්‍රථම පෞද්ගලික උසස් අධ්‍යාපන ආයතන 1992 දී බිහි විය. ලොව පුරා පිහිටි පෞද්ගලික අංශයේ අධ්‍යාපන ආයතන වල ඇති බොහෝ ලක්ෂණ මේවායෙහිද අඩංගු වන අතර තුරදී, රුසියානු පෞද්ගලික උසස් අධ්‍යාපනයෙහි එයටම ආවේණික ලක්ෂණ ද ඇත. උසස් අධ්‍යාපන ආයතන නිර්මාණය කිරීමේදී සැලකිය යුතු මට්ටමේ රජයේ දායකත්වය සහ රජයේ සම්පත් සහ විවිධ රජයේ ආධාරය ලත් සංවිධාන සහිතව පෞද්ගලික ආයතන සමඟ අඛණ්ඩ සංයෝජනය. 2005 වන විට, රාජ්‍ය ආයතන 655 ට සාපේක්ෂව පෞද්ගලික ආයතන 413ක් තිබිණි. උසස් අධ්‍යාපන අංශයේ සමස්ත ලියාපදිංචි වීම් වලින් සියයට 15ක් පමණ පෞද්ගලික උසස් අධ්‍යාපන අංශයෙන් සමන්විත වේ. පෞද්ගලික විශ්ව විද්‍යාලයන්හී මූලික ලක්ෂණ නම්: වෙළෙඳපොළ පදනම් කරගත් අධ්‍යයන වැඩසටහන් සහ උපකරණ සහ පර්යේෂණ යටිතල පහසුකම් කෙරෙහි එතරම් ආයෝජනයක් අවශ්‍ය නොකරන, අනෙකුත් ක්ෂේත්‍ර, විෂය නිර්දේශයන්හී නම්‍යශීලී භාවය ඇති, අඩු ඇතුළත් වීමේ සුදුසුකම් සහිත, පර්යේෂණ සඳහා ඉලක්ක කිරීම සීමා සහිත සහ මුදල් සපයා ගැනීම සඳහා පන්ති ගාස්තු මත යැපෙන ඒවා වීමයි.

**චීනය :** 1980 දශකය වන තෙක්ම මහජන චීන සමූහාණ්ඩුව පෞද්ගලික අංශයේ උසස් අධ්‍යාපනය සඳහා අවසර නොදුණි. පළමු පෞද්ගලික උසස් අධ්‍යාපන ආයතනය 1978 දී දැකගත හැකි වූ නමුත් ප්‍රධාන පිබිදීම ආරම්භ වූයේ 1980 දශකයේදී ය. 2000 වර්ෂය වන විට පෞද්ගලික ආයතන 1200 කට වැඩි සංඛ්‍යාවක් පැවතිණි. 2003 දී, පෞද්ගලික අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීම සඳහා වූ නීතිය මඟින් පෞද්ගලික විශ්ව විද්‍යාල පිහිටුවීමට අවසර ලබා දුණි. අධ්‍යාපන අමාත්‍යංශය මඟින් පිළිගන්නා උපකාරක හෝ/ සහ ප්‍රථම උපාධි පිරිනමන පිළිගත් පෞද්ගලික ආයතන සමස්ත සංඛ්‍යාව 2000 දී 43 ක සිට 2006 වන විට 278 දක්වා වර්ධනය විය. වර්තමානයේදී චීනයේ උසස් අධ්‍යාපනය සඳහා ලියාපදිංචි වීම් වලින් 10% ක්ම සිදුවන්නේ පෞද්ගලික උසස් අධ්‍යාපන සඳහාය. පෞද්ගලික අධ්‍යාපනය සඳහා රජය ඉඩකඩ ලබාදීමට මූලික හේතුව වූයේ රාජ්‍ය අංශයේ උසස් අධ්‍යාපනයේ ප්‍රමාණවත් ව්‍යාප්තියක් සඳහා රජයට මූල්‍ය ප්‍රතිපාදන සැලසිය නොහැකි වීමයි. 1997 දී පෞද්ගලික අධ්‍යාපනයේ ලාභ නොඉපයන ස්වභාවය නැවත තහවුරු කළ පෞද්ගලික අධ්‍යාපනය සම්බන්ධයෙන් වූ ප්‍රථම රෙගුලාසි රජය නිකුත් කළේය. වර්තමානයේදී රජය සක්‍රියව පෞද්ගලික උසස් අධ්‍යාපනය ප්‍රවර්ධනය කරන අතර පෞද්ගලික උසස් අධ්‍යාපන ආයතන සඳහා සහන සහ දිරිදීමනා ලබා දේ.

**විශ්ව විද්‍යාල අංශය තුළ රැකියා අරමුණු කරගත් විද්‍යා හා තාක්‍ෂණ පාඨමාලා වලට ලියාපදිංචි කර ගැනීමේ ප්‍රමාණය ඉහළ නැංවිය යුතුය.** විශ්ව විද්‍යාල අංශය තුළ ඉහළ ලියාපදිංචි කර ගැනීම් සහ වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් ඉඩකඩක් වතිනුයේ අලුතෙන් පිහිටුවන ලද කලාපීය විශ්ව විද්‍යාල වලය. මෙම ආයතන වල ලියාපදිංචි වීමේ ව්‍යාප්තිය සිදුවිය යුත්තේ මැදි ආදායම් උපයන රටක් ලෙස ශ්‍රී ලංකාවේ නැගී එන ආර්ථික අවශ්‍යතා වලට සම්බන්ධ කළ. සෘජු ලෙස රැකියා අරමුණු කරගත් වැඩසටහන් තුළිනි. මේවා ප්‍රධාන වශයෙන්ම මැලේසියාව, දකුණු කොරියාව, තායිලන්තය, බ්‍රසීලය, චිලී සහ ආර්ජන්ටිනාව වැනි රටවල වූ පරිදි විද්‍යා හා තාක්ෂණය මූලික කරගත් ක්ෂේත්‍රයන් වීමට ඉඩ ඇත.

**උසස් අධ්‍යාපන ප්‍රවේශය සහ ව්‍යාප්තිය පුළුල් කිරීමට ප්‍රතිපත්තිමය විකල්පයන් සම්පාදනය සඳහා ප්‍රධාන පූර්ව අවශ්‍යතාවයක් වනුයේ මනා උසස් අධ්‍යාපන කළමණාකරන තොරතුරු පද්ධතියක් (HEMIS) පිහිටුවීමයි.** ස්ථාවර උසස් අධ්‍යාපන කළමණාකරන තොරතුරු පද්ධතියකින් තොරව මෙම පද්ධතිය පිළිබඳ සැලසුම් කිරීම සහ අධීක්ෂණය කළ නොහැකි වේ. උසස් අධ්‍යාපන අමාත්‍යංශය සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විශ්වවිද්‍යාල ආවරණය කරනා උසස් අධ්‍යාපන කළමණාකරන තොරතුරු පද්ධතියක් ස්ථාපනය කරමින් සිටී. කාලයත් සමඟ උසස් අධ්‍යාපන අමාත්‍යංශය, ශ්‍රී ලංකා උසස් තාක්ෂණවේදී අධ්‍යාපන ආයතනය සහ පෞද්ගලික උසස් අධ්‍යාපන අංශය ඇතුළත් වන ලෙස උසස් අධ්‍යාපන කළමණාකරන තොරතුරු පද්ධතිය ව්‍යාප්ත කළ යුතු වේ.

## උසස් අධ්‍යාපනය සඳහා සැලසුම්කරණය සහ මූල්‍ය ප්‍රතිපාදනය වෙනුවෙන් නව ආදර්ශකයක් අවශ්‍ය කෙරේ.

**උසස් අධ්‍යාපන අංශයේ සංවර්ධනය සඳහා ප්‍රවේශය සහ ව්‍යාප්තිය, ගුණාත්මකභාවය, පාලනය සහ අදාළත්වය ආදී එහි සියලු පැතිකඩ සඳහා සැලකිය යුතු සම්පත් ප්‍රමාණයක් අවශ්‍ය කරනු ඇත.** දැනට ඇති සම්පත් මගින් සංවර්ධනය සඳහා කුමන විකල්පයන් සිදුකළ හැකි වන්නේ දැයි හඳුනා ගැනෙනු ඇත. එහි ප්‍රතිඵලයක් වශයෙන් සංවර්ධන ක්‍රමෝපාය සඳහා සම්පත් සංචලනය වැදගත් වන සේම පවතින සම්පත් කාර්යක්ෂම අයුරින් භාවිතයට ගනු ලබන බවට තහවුරු කිරීමද වැදගත් වේ.

### *අභියෝග*

**අනෙකුත් මැදි ආදායම් උපයන රටවල් සහ සංවර්ධනය වෙමින් පවතින රටවල් සමඟ සැසඳීමේදී ශ්‍රී ලංකාව උසස් අධ්‍යාපනය වෙනුවෙන් ප්‍රමාණවත් ආයෝජන සිදුනොකරයි.** ඊට එහි ජාතික ධනයෙන් ප්‍රමාණාත්මකව ඉතා සුළු කොටසක් වියදම් කරන අතර වෙනත් අංශයන්ට සාපේක්ෂව අධ්‍යාපනය සඳහා වැය කරනුයේ එහි සමස්ත රජයේ අයවැයෙන් ඊටත් වඩා සුළු කොටසකි(තෙවන ප්‍රස්තාරය). සංවර්ධනය වෙමින් පවතින අනෙකුත් රටවලට සාපේක්ෂව සමස්තයක් වශයෙන් දකුණු ආසියාතික රටවල් අධ්‍යාපනය සඳහා අඩු ආයෝජන දරයි. ඒ අතර ශ්‍රී ලංකාව අධ්‍යාපනය සඳහා ආයෝජනය කරනුයේ දකුණු ආසියාවේ සාමාන්‍යය මට්ටමට වඩා අඩුවෙනි. විශ්ව විද්‍යාලවල ඉගැන්වීම් සහ පර්යේෂණ සිදු කිරීම සඳහා සහ විකල්ප උසස් අධ්‍යාපන ආයතන සඳහා රාජ්‍ය ආයෝජන දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස (සියයට 0.5කට අඩු) සහ උසස් අධ්‍යාපන සඳහා රජයේ අයවැයෙන් වෙන්කෙරුණු කොටස (සියයට 18කට අඩු) යන මේ දෙයාකාරයෙන්ම පහළ මට්ටමක පවතී. තවද වර්තමාන ගෝලීය ආර්ථික පරිසරය හමුවේ රට දුෂ්කර මූල්‍ය වාතාවරණයකට මුහුණ දෙන අතර කෙටි කාලීනව උසස් අධ්‍යාපන අංශය සඳහා රාජ්‍ය මුදල් සම්පාදනය පුළුල් කිරීම සඳහා ප්‍රමාණවත් අවස්ථාවන් නොලැබෙනු ඇත.

**ගෝලීය ආර්ථික සහ මූල්‍ය අර්බුදය පවතින කාලපරිච්ඡේදයේදී උසස් අධ්‍යාපනය සඳහා ආයෝජන ආරක්‍ෂා කර ගත යුතු වේ.** මන්ද ආර්ථිකය නැවත යථා තත්ත්වයට පත්වූ පසු අවශ්‍ය නිපුණතා සහිත මානව සම්පත් තිබෙනු ඇත. ලෝකයේ සහ කලාපයේ බොහොමයක් රටවල් වල මෙන්ම, ලංකාවද මෑතක දී ඇති වූ ලෝක අර්බුදයේ බලපෑමට දැනටමත් ලක්වී ඇත. ඇත්ත වශයෙන්, මීළඟ වසර 8 සඳහා සියයට 4ක පමණ වන වර්ධන අනුපාතයක් පිළිබඳව වූ සර්ව අශුභවාදී උපකල්පනයක් යටතේ, උසස් අධ්‍යාපන ක්‍රමයට එහි එකම අරමුණු ළඟා කර ගැනීම සඳහා, කාල පරිච්ඡේදය ඔස්සේ දළ දේශීය නිෂ්පාදිතයෙහි එහි දායකත්වය සියයට 1ක් දක්වා ඉහළ නැංවිය යුතු වේ. මෙය කළ නොහැක්කක් නොවන අතර, එය ශ්‍රී ලංකාව එය සමඟ තරඟ කරන රටවල් හා සම තත්ත්වයේ තබනු ඇත. නමුත්, එය නිසැක වශයෙන්ම වෙනත් අඩු ඵලදායී අංශයන් හී දායකත්වය ඒ අනුව අඩු කිරීමට අවශ්‍ය වේ. මෙම අනුකරණයන් රාජ්‍ය මූල්‍ය සම්පාදනය ඌන පූරණය සඳහා අතිරේක නිර්මාණාත්මක විධි අවශ්‍ය සහ වැළැක්විය නොහැකි අංගයන් බවට දැඩිව යෝජනා කෙරේ.

**ප්‍රස්ථාරය 3: ජාතික ආදායමෙන් සහ රාජ්‍ය අයවැයෙහි අනුපාතයක් ලෙස අධ්‍යාපනය සඳහා රාජ්‍ය වියදම්**




උසස් අධ්‍යාපනයේ මූල්‍ය සම්පාදනය සඳහා පෞද්ගලික අංශය සතු හැකියාවෙහි ප්‍රයෝජන ලබා ගැනීමට ශ්‍රී ලංකාව අසමත් වේ. පෞද්ගලික උසස් අධ්‍යාපන අංශය පවතින අතර, ඒවා (විදේශීය) විශ්ව විද්‍යාල උපාධි හෝ වෘත්තීමය ඩිප්ලෝමා සහ සහතිකපත් පාඨමාලා මට්ටමේ හෝ වේවා, උසස් අධ්‍යාපනය සඳහා මං පෙත් විවර කිරීමේ කාර්යයේදී වැදගත් කාර්ය භාරයක් ඉටු කරයි. පෞද්ගලික උසස් අධ්‍යාපන ආයතන වලින් බිහිවන උපාධිධාරීන් හට ද පොදුවේ රැකියාවක් සොයා ගැනීම සාපේක්ෂ වශයෙන් පහසු වේ. කෙසේ වෙතත් ප්‍රතිපත්තිමය පරිසරය, ප්‍රධාන වශයෙන් රජයේ උසස් අධ්‍යාපන අංශය වෙත අවධානය යොමු කරන අතර පෞද්ගලික උසස් අධ්‍යාපන අංශය මඟ හැරීමේ ප්‍රවණතාවයක් දක්නට ඇත. මෙය, උසස් අධ්‍යාපනය සඳහා පෞද්ගලික ආයෝජන දිරිමත් කිරීම සහ උසස් අධ්‍යාපනයෙහි රාජ්‍ය - පෞද්ගලික හවුල්කාරීත්වයන් ඇති කිරීමේ ගෝලීය ප්‍රවණතාවයට පටහැනි වේගඑබැවින්, ඉහතදී සඳහන් කළ පරිදි මෙන්ම නැවත අවධාරණය කළ යුතු කරුණ නම්, ශ්‍රී ලංකාව සියලු මැදි ආදායම් උපයන රටවල් අතර අවම වශයෙන් සංවර්ධිත පෞද්ගලික උසස් අධ්‍යාපන අංශයන් ඇති රටක් බවයි. තවදුරටත්, ඉන්දියාව, පාකිස්ථානය සහ බංග්ලාදේශය ඇතුලු වඩා දුගී පහළ ආදායම් ලබන රටවල් බොහෝමයක්, උසස් අධ්‍යාපනය සඳහා පෞද්ගලික අංශයේ ආයෝජන ආකර්ෂණය කර ගනිමින් ශ්‍රී ලංකාව අභිබවයි.

## ක්‍රමෝපායික සංවර්ධන විකල්ප

**උසස් අධ්‍යාපනය සඳහා රජයේ සම්පත් යෙදවීම සඳහා නව ආදර්ශකය ප්‍රවේශයට වඩා ප්‍රධාන වශයෙන් ගුණාත්මකභාවය සහ අදාළත්වය පිළිබඳ අරමුණු කළ යුතු වේ.** පසුගිය වසර 10-15 ක් තිස්සේ රජයේ ප්‍රධාන ප්‍රතිපත්තිමය ප්‍රමුඛතාවය වූයේ සෑම පළාතකටම අවම වශයෙන් එක් විශ්ව විද්‍යාලයක් බැගින් වන පරිදි නව කලාපීය විශ්ව විද්‍යාල නිර්මාණය කිරීම තුළින් විශ්ව විද්‍යාල අධ්‍යාපනය සඳහා ඇති ඉඩකඩ පුළුල් කිරීමයි. වර්තමානයේදී රජයට අවශ්‍ය වන්නේ උසස් අධ්‍යාපන අංශය තුළ වඩා ඉහළ මට්ටමේ සංවර්ධනයක් කරා යොමුවීම සහ ගුණාත්මක භාවය සහ ආර්ථික සමාජීය අදාළත්වය වැඩි දියුණු කිරීම සඳහා ඉහළම ප්‍රමුඛතාවයක් පිරිනැමීමටයි. මේ අනුව මේ සඳහා අවශ්‍ය කරනු ලබන ප්‍රධාන මිනුම් කිහිපයක් වේ. මෙම සියලු මිනුම් දඬු එකට එක් කිරීමෙන් හා මෙම ක්‍රමය තුළ කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම සඳහා විශේෂයෙන්ම වර්තමාන ආර්ථික වර්ධන අනුපාතය තිරසාරව පවත්වා ගත නොහැකි නම්, උසස් අධ්‍යාපනය සඳහා දේශීය ආදායමෙන් වැඩි ප්‍රමාණයක් ආයෝජනය කිරීම අවශ්‍ය වනු ඇත. (හතර වන ප්‍රස්ථාරය)

**ප්‍රස්ථාරය 4: දළ දේශීය නිෂ්පාදිතයෙන් කොටසක් ලෙස උසස් අධ්‍යාපන වියදම් (ප්‍රක්ෂේපිත, 2012)**




**උසස් අධ්‍යාපන අංශය සඳහා වන රාජ්‍ය සම්පත් වලින් වඩා වැඩි කොටසක් විකල්ප උසස් අධ්‍යාපන අංශය සඳහ වෙන් කළ යුතු වේ.** විකල්ප උසස් අධ්‍යාපන අංශය සංවර්ධනය කිරීම සඳහා විශාල ප්‍රමුඛතාවයක් දිය යුතු වේ. ප්‍රධාන වශයෙන්, මෙම අංශය සෘජුව රැකියා අරමුණු කොට ගත් පාඨමාලා පවත්වයි. සාමාන්‍යයෙන් මෙම පාඨමාලා කාලය විශ්ව විද්‍යාල උපාධි වැඩසටහන් සඳහා ගතවන කාලයට වඩා අඩුවන අතර, ඊට වඩා අඩු වියදමක් ද සහිතයි. එම නිසා, මෙම අංශය වැඩි දියුණු කිරීම, පිරිමැසුම් දායක මෙන්ම ආර්ථිකමය වශයෙන් කාර්යක්ෂම විකල්පයක් වේ.

**ශිෂ්‍ය ඉගෙනුම් වල ගුණාත්මක භාවය ඉහළ නැංවීම සහ ඉගැන්වීමට සහ පර්යේෂණ වැඩි දියුණු කිරීමට නවෝත්පාදක ප්‍රාරම්භකයන් සඳහා මූල්‍ය සම්පාදනය කිරීම, විශ්වවිද්‍යාල සඳහා අරමුදල් ලබා දීම සඳහා වන ප්‍රධාන ප්‍රතිපත්තිමය ප්‍රමුඛතාවයන් විය යුතු වේ.** මෙමඟින් අදහස් වනු ඇත්තේ, විශ්වවිද්‍යාලයන්හී සමස්ත සැලසුම් සහ අයවැය යෝජනා සඳහා අරමුදල් සැපයිය යුතු වනුයේ මෙම සැලසුම් සහ යෝජනා මඟින් ප්‍රවේශය සහ ව්‍යාප්තිය කෙරෙහි ඇති කරන බලපෑමට වඩා ප්‍රධාන වශයෙන්, ගුණාත්මක භාවය සඳහා ඉන් ඇති වන බලපෑම් සැලකිල්ලට ගැනීමෙනි. ඊට අමතරව, එනම්, සියයට 10-15 ත් අතර ප්‍රමාණයක්, විශ්වවිද්‍යාල සඳහා ප්‍රයෝජනයට ගත හැකි සම්පත් වලින් කොටසක්, පීඨයන්හී වැඩසටහන් වල ගුණාත්මක භාවය සහ අදාළත්වය ඉහළ නැංවීම සඳහා වන ක්‍රියාකාරීත්වය පාදක කරගත් ප්‍රාරම්භකයන්ට අරමුදල් ලබා දීම සඳහා වෙන් කළ යුතු වේ.

**සංවර්ධනය සඳහා ආදායම් උත්පාදනයට උසස් අධ්‍යාපන ආයතන දිරිමත් කිරීම අවශ්‍ය කෙරේ.** උසස් අධ්‍යාපන ආයතන මඟින් ඉදිරිපත්කර ඇති විවිධාකාරයේ ආදායම් උත්පාදක සේවා ගණනාවක් වේ. මීට පර්යේෂණ සහ උපදේශක සේවා සැපයීම, කෙටි පාඨමාලා පැවැත්වීම සහ පශ්චාත් සහ ප්‍රථම උපාධි පාඨමාලා, ඩිප්ලෝමා සහ සහතික පත්‍ර පාඨමාලා ගාස්තු මඟින් උපයා ගනු ලබන ආදායම ඇතුළත් වේ. සුදුසු ප්‍රතිපත්තිමය ප්‍රාරම්භකයන් හරහා, තම ආදායම් වැඩිකර ගැනීමට රජය උසස් අධ්‍යාපන ආයතන දිරිමත් කිරීම අවශ්‍ය කෙරේ. මේ අනුව, උසස් අධ්‍යාපන ආයතන මඟින් උපයන ආදායම, රජයේ ප්‍රතිපාදන වලට අතිරේකව සිදුවීම සහ තමන් විසින් උපයා ගන්නා ආදායම ඉහළ යාමේදී උසස් අධ්‍යාපන ආයතන සඳහා අයවැයෙන් යෝජිත අරමුදල් අඩු නොකිරීම ඉතා වැදගත් වේ. මීට අමතරව, උදාහරණයක් ලෙස, ව්‍යාපාරික මධ්‍යස්ථාන සහ තාක්ෂණික වාණිජකරණ කාර්යාල පිහිටුවීම හරහා, ආදායම් ඉපයීම ක්‍රියාකාරකම් සඳහා ආයතනික වටපිටාව වැඩි දියුණු කිරීම අවශ්‍ය කෙරේ.

**පද්ධතිය තුළ අභ්‍යන්තර කාර්යක්ෂමතාවය වැඩි කිරීමට සහ පිරිවැය අඩු කිරීමට අවශ්‍ය පියවර ක්‍රියාත්මක කිරීම අවශ්‍ය වේ.** මීට, අනධ්‍යයන කාර්ය මණ්ඩලයට සාපේක්ෂව අධ්‍යයන කාර්ය මණ්ඩලයේ ඉහළ අනුපාතයක්, ඉහළ සිසු-ගුරු අනුපාතයක් සහ මෙවලම් හී සැපයුම් ලබා ගැනීම වැනි ක්‍රියාකාරකම් හී වැඩි දියුණු කළ ක්‍රියා පටිපාටිමය කාර්යක්ෂමතාවය ආදී වශයෙන් වූ ගත හැකි විවිධ පියවර ගණනාවක් ඇතුළත් වේ. කෙසේ වෙතත්, උසස් අධ්‍යාපන අංශය තුළ උත්පාදනය කරනු ලබන පිරිවැය ශේෂයන් අංශය තුළම රඳවා ගැනීම වැදගත් වේ. තවද යම් උසස් අධ්‍යාපන ආයතනයක් තුළ උත්පාදනය කරනු ලබන කුමනාකාරයේ හෝ පිරිවැය ශේෂයන්, එම ආයතන තුළම නැවත ආයෝජනය සඳහා ඉඩ සැලසීම අවශ්‍ය කෙරේ.

**වඩා වැඩි සම්පත් ප්‍රමාණයක් සංචලනය කිරීමට සහ තම උසස් අධ්‍යාපන අංශයන් සංවර්ධනය කිරීම සඳහා ආසියාවේ සහ යුරෝපයේ ඉහතදී කොමියුනිස්ට් රටවල් ලෙස හැඳින්වූ රටවල් ද ඇතුලුව අනෙකුත් රටවලට, උසස් අධ්‍යාපනයෙහි රාජ්‍ය - පෞද්ගලික හවුල්කාරීත්වයන් සහ පෞද්ගලික අංශයේ අයෝජනය සඳහා හිතකර පරිසරයක් නිර්මාණය කිරීම මහෝපකාරී වී ඇත.** මෙම විකල්පය ශ්‍රී ලංකාවේ ප්‍රතිපත්ති සම්පාදකයන් විසින් ඉදිරියට ගෙන යාම අවශ්‍ය වේ. උසස් අධ්‍යාපනය සඳහා පෞද්ගලික අංශයේ සහභාගීත්වය පුළුල් කිරීමට වැදගත් පියවරක් වනුයේ හොඳ ගුණාත්මක බවින් යුතු පෞද්ගලික උසස් අධ්‍යාපන ආයතන ඇති වීම සහ ඒවා වර්ධනය සඳහා පහසුකම් සලසනු ලබන, මනා පිළිගත් ආයතන ඇති කිරීමේ ක්‍රමයක් ස්ථාපනය යි. ශ්‍රී ලංකාවට ද ස්වීඩනය, චිලී සහ ඇමෙරිකා එක්සත් ජනපදයේ සමහර ප්‍රාන්ත වල මෙන් පෞද්ගලික උසස් අධ්‍යාපන ආයතන සඳහා රාජ්‍ය අංශයේ සහනාධාර විකල්යක් පිළිබඳව සලකා බැලිය හැකි වේ. ඊට අමතරව, සමානත්වය සහ සමාජ සාධාරණත්වය ප්‍රවර්ධනය කිරීම සඳහා, පෞද්ගලික උසස් අධ්‍යාපන ආයතනයන්හි ලියාපදිංචි වී සිටින දුප්පත් ශිෂ්‍යයන් සඳහා වවුචර, දීමනාවන් සහ ණය යෝජනා ක්‍රම හඳුන්වා දීමට හැකි වේ.

## ශ්‍රී ලංකාවේ සංස්කෘතිය සහ සමාජය පෝෂණය කිරීම සඳහා උසස් අධ්‍යාපනය අද්විතීය ස්ථානයක පවතී.

**රටක සංස්කෘතික, දේශපාලනික සහ සමාජ පැවැත්ම සඳහා උසස් අධ්‍යාපන ආයතන කේන්ද්‍රීය වැදගත් කමක් උසුලයි.** ඒවා සමාජයක සදාචාර සහ සාරධර්ම සකස් කරන අතර, පිබිදුණු පුරවැසි භාවය සහ ප්‍රජාතන්ත්‍රවාදය සඳහා අවකාශය නිර්මාණය කරයි. ශ්‍රී ලංකාව වැනි විවිධ වාර්ගික කණ්ඩායම් සහ ආගමික කොට්ඨාස කිහිපයක් ඇති මෙන්ම, දිගු කාලයක් තිස්සේ පැවති ජනවාර්ගික බෙදුම්වාදී අරගලයකින් මිදී නැඟී එමින් සිටින රටකට, උසස් අධ්‍යාපනයේ මෙම පැතිකඩ විශේෂ වශයෙන් වැදගත් වේ.

**උසස් අධ්‍යාපන අංශය සාමකාමී, බහු වාර්ගික, බහු ආගමික සහ බහු සංස්කෘතික ශ්‍රී ලංකාවක් සඳහා හිතකර වාතාවරණයක් නිර්මාණය කළ හැකි අතර ඒ සඳහා ප්‍රමුඛත්වය ගෙන කටයුතු කළ යුතු වේ.** වර්තමානයේදී රට මුහුණ දෙමින් සිටින විශාලතම අභියෝගය නම්, රටෙහි සියලු ප්‍රදේශයන්හි අභිමානය, අන්‍යෝන්‍ය විශ්වාසය සහිතව, සාමයෙන් යුතුව විවිධ ජාතීන් වලට සහ ආගම්වලට අයත් පුද්ගලයන් හට එකට කටයුතු කරමින් ජීවත් විය හැකි සමාජයක් ගොඩනැඟීමයි. මාර්ග ගණනාවක් ඔස්සේ එවැනි සමාජයක් බිහි කිරීම සඳහා උසස් අධ්‍යාපන ආයතනවලට දායක විය හැක. පළමුව, විශේෂයෙන්ම කලා, මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යා යන කේන්ද්‍රයන්හී අධ්‍යයන පාඨමාලා සහ පර්යේෂණ ක්‍රියාකාරකම් හී අන්තර්ගතය මඟින් බහු වාර්ගික සහ බහු ආගමික සමාජයන්හී ඇති ධනාත්මක ලක්ෂණ, සහ එවැනි සමාජයන්හී ස්ථාවර භාවය සහ සමූහිකත්වය සඳහා අවශ්‍ය කරන ගුණාංග පිළිබඳව පැහැදිළි කිරීම සහ ඒ පිළිබඳ අවධාරණය කිරීම සිදු කළ හැකි වේ. දෙවනුව, සියලුම උසස් අධ්‍යාපන ආයතන පාහේ, ඒවායේ ශිෂ්‍යයන් සහ කාර්ය මණ්ඩලය අතරේ විවිධ ජාතීන්ට සහ ආගම් වලට අයත් සම්මිශ්‍රණයක් දැකිය හැකි වේ. මෙම කරුණු හේතුවෙන් විවිධ කණ්ඩායම් අතර සහයෝගය සහ සහජීවනය සඳහා වූ විශිෂ්ට පරිසරයක් ඇති කරයි. තෙවනුව, උසස් අධ්‍යාපන ආයතන, එකිනෙක අතර බුද්ධිමය, සංස්කෘතිකමය සහ ක්‍රියාකාරකම් හී නිරත වෙති. මේ ක්‍රියාකාරකම් මඟින් රටෙහි විවිධ ප්‍රදේශවල සිටිනා විවිධ ජාතීන්ට සහ ආගම් වලට අයත් ශිෂ්‍යන්ට එකිනෙකා මුණ ගැසීමට හා එකට එක්ව කටයුතු කිරීමේ හැකියාව ලැබේ. සිව්වෙනුව, විවිධ ජාතීන්ට සහ ආගමික කොටස් වලට අයත් ශාස්ත්‍රඥයන් අතර එකට එක්වී පර්යේෂණවල නියැලීම සඳහා වාතාවරණයක් උසස් අධ්‍යාපන ආයතන විසින් සලසා දෙයි.

**ප්‍රජාතන්ත්‍රවාදී රටක් සඳහා අවශ්‍ය පිබිදුණු ජනතාවක් නිර්මාණය සහ ප්‍රවර්ධනය සඳහා උසස් අධ්‍යාපන අංශය පෙරමුණ ගෙන ක්‍රියා කළ යුතු වේ.** ශ්‍රී ලංකාවේ පැවැතියාක් මෙන් දිගුකාලීන අවි ගැටුම් හේතුවෙන් හොඳින් ක්‍රියාත්මක වන සිවිල් පරිපාලනයක් සහ දේශපාලනික ප්‍රජාතන්ත්‍රවාදය සඳහා අවශ්‍ය සාරධර්ම සහ ආකල්ප සෝදා පාලුවට ලක් වේ. උසස් අධ්‍යාපන ආයතන තම ඉගැන්වීම් සහ පර්යේෂණ තුළින්, දේශපාලනික ප්‍රජාතන්ත්‍රවාදයේ ප්‍රධාන අංගයන් වන බහුවිධ මතවාදය, සමාජමය වශයේ අනෙකා ඉවසීම, විවිධත්වය සඳහා ගරු කිරීම සහ සාධාරණීය විවාද වැනි සාරධර්ම හා ආචාර ධර්මයන් දියුණු කිරීම සහ ශක්තිමත් කිරීම අවශ්‍ය කෙරේ.

## වෙනසක් සඳහා පෙරමුණ ගැනීම සහ සංවර්ධනය වේගවත් කිරීම

**උසස් අධ්‍යාපන අංශයේ සංවර්ධනය ශ්‍රී ලංකාවට ඉතා වාසිදායක අගනා දෙයක් වනු ඇත.** තවද එය දේශපාලනික බලධාරීන්ගේ සහ ප්‍රතිපත්ති සම්පාදකයන්ගේ දුරදක්නා නායකත්වය සහ උසස් අධ්‍යාපන ආයතන ප්‍රජාවගේ අයිතිකාරීත්වය සහ දිගුකාලීන කැපවීම අවශ්‍ය කරනු ලබන සංකීර්ණ සහ අභියෝගාත්මක ක්‍රියාවලියක් වනු ඇත.

**උසස් අධ්‍යාපනයේ සංවර්ධනය සඳහා දේශපාලනික බලධාරීන්ගේ නිරන්තර, දිගුකාලීන කැපවීම අවශ්‍ය කරයි.** විශේෂයෙන්, පාලනයේ දැකිය හැකි නවෝත්පාදක ප්‍රාරම්භකයන් දුෂ්කර විය හැක්කේ මේවා මධ්‍යම රජයේ සිට විශ්ව විද්‍යාල සහ උසස්

තාක්ෂණික ආයතන වැනි තනි ආයතන වලට බලය සහ අධිකාරීත්වය බෙදාහැරීම සඳහා නිතරම දායක වන බැවිනි. ඊට අමතරව, බදු මුදල් ඉපයීමට වඩා පුළුල් වූ පරාසයක පැතිරී ඇති ආදායම් ඉපැයීම් ක්‍රම හඳුන්වා දීම සහ දිරි දීමනා සහ ඇගයීම් වැනි ක්‍රියාකාරීත්වය මත පදනම් වූ මූල්‍ය සම්පාදන ක්‍රම හඳුන්වා දීම වැනි විශ්ව විද්‍යාලයන් හී අරමුදල් සම්පාදනයේ නූතන නවෝත්පාදකයන්, සමහරක් ගතානුගතික පුද්ගලයන් ඔවුන්ගේ සුපුරුදු මාර්ගයෙන් බැහැරට ගමන් කරවන බැවින් ආන්දෝලනාත්මක විය හැක. එබැවින්, එවැනි ප්‍රතිපත්තිමය ප්‍රාරම්භකයන් සඳහා දේශපාලන පද්ධතියෙහි ඉහළ මට්ටමෙන් මනා දැක්මකින් හා තිරසාර බවින් යුතු නායකත්වයක් අවශ්‍ය වේ.

**ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපන සංවර්ධන ක්‍රමෝපාය විශේෂයෙන්ම උගත් ප්‍රජාව සහ දසත පැතිරී ඇති අයිතිකාරීත්වය දරන්නන් අතර පුළුල් වශයෙන් සන්නිවේදනය කළ යුතු වේ.** වඩා හොඳ තත්ත්වයේ උසස් අධ්‍යාපන සේවා ලබා දීමේදී තනි අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන් ඉතා වැදගත් වේ. එබැවින්, සාර්ථක උසස් අධ්‍යාපන ක්‍රමෝපායන් ඉතා වැදගත් වේ. එබැවින්, සාර්ථක උසස් අධ්‍යාපන ක්‍රමෝපායක සංවර්ධනය සඳහා ශාස්ත්‍රඥයන්ගේ අයිතිකාරීත්වය සහ කැපවීම අත්‍යවශ්‍ය කොන්දේසියක් වේ. උසස් අධ්‍යාපන අමාත්‍යංශය, ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව සහ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව උසස් අධ්‍යාපන සංවර්ධන වැඩසටහනෙහි අන්තර්ගතය, අරමුණ සහ වස්තු බීජය උගත් ප්‍රජාවට සන්නිවේදනය කළ යුතු වේ. ක්‍රියාත්මක කිරීම සඳහා ක්‍රමෝපාය තෝරා ගැනීම සහ ඒවායෙහි අනුපිළිවෙල, උගත් ප්‍රජාවගේ සහභාගීත්වය, අයිතිකාරීත්වය සහ කැපවීම සමඟ ළඟා කර ගත යුතු වේ.

**උතුරු සහ නැගෙනහිර මෙන්ම අනෙකුත් පිටිසර පළාත් වැනි සංවර්ධනය අඩාල ප්‍රදේශ වල පිහිටි උසස් අධ්‍යාපන ආයතන සඳහා විශේෂ සහ ප්‍රමුඛ ප්‍රතිපත්තිමය අවධානයක් අවශ්‍ය කෙරේ.** විවිධ උසස් අධ්‍යාපන ආයතනයන්හී සංවර්ධන මට්ටම අනුව උසස් අධ්‍යාපන සංවර්ධන ක්‍රමෝපාය එකිනෙකට වෙනස් විය යුතු වේ. කොළඹ, නුවර, සහ මාතර වැනි නගර ආශ්‍රිතව පිහිටි වඩා පැරණි, ස්ථාවර පැවැත්මක් සහිත උසස් අධ්‍යාපන ආයතන වඩා දියුණු ඉහළ සංවර්ධන අවධියක පසු වේ. එහි ප්‍රතිඵලයක් ලෙස, ඒවාට අපේක්ෂා සහගත සංවර්ධන ප්‍රාරම්භකයන් කරා යොමු විය හැකි වේ. මීට ප්‍රතිවිරුද්ධව, උතුරු නැගෙනහිර සහ අනෙකුත් පිටිසර පළාත් වැනි, සංවර්ධනය අඩාල ප්‍රදේශයන්හී පිහිටි උසස් අධ්‍යාපන ආයතන, අඩු සුදුසුකම් ලත් කාර්යය මණ්ඩල, අඩු පහසුකම සහ තවමත් ස්ථාපනය කරමින් පවතින කළමණාකරන පද්ධති සහ ක්‍රියාවලීන් සමඟින් සාපේක්ෂ වශයෙන් ඌන සංවර්ධිතය. මෙම උසස් අධ්‍යාපන ආයතන සඳහා වැඩි ප්‍රතිපත්තිමය අවධානයක් සහ ක්‍රමෝපායික අරමුදල් සම්පාදනයක් අවශ්‍ය කෙරේ.

**උසස් අධ්‍යාපන සංවර්ධන ක්‍රමෝපාය ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලියේ දී ජනමාධ්‍ය ද සම්බන්ධ වී සිටීම අවශ්‍ය වේ.** තොරතුරු සැපයීමෙන් සහ සාමාන්‍ය ජනතාවගේ ආකල්පයන් හැඩ ගැස්වීමෙන් ජනප්‍රිය මාධ්‍ය ඉතා වැදගත් කාර්ය භාරයක් ඉටු කරයි. උසස් අධ්‍යාපන අංශය විසින් අත්පත්කර ගත් ජයග්‍රහණ, එහි අනාගත අභියෝග සහ එම අභියෝග ජයගැනීම සඳහා යොදාගත් ක්‍රමෝපාය පිළිබඳ ජනමාධ්‍ය වෙත සන්නිවේදනය කිරීම සහ අවබෝධ කරවීම වැදගත් වේ. මෙය, වෙනස සහ සංවර්ධනය සඳහා මඟ පෙන්වන නායකයන් හට උසස් අධ්‍යාපන ක්‍රමයේ අනාගතය පිළිබඳ ඔවුන්ගේ දැක්ම සහ එම දැක්ම වෙත ළඟාවීමේ ඔවුන්ගේ ක්‍රමෝපාය පිළිබඳ ව සාමාන්‍ය ජනතාවට සන්නිවේදනය කිරීමට ඉඩකඩ ලබාදෙයි. ජනතාවගේ අවබෝධය සහ සහයෝගය, උසස් අධ්‍යාපන සංවර්ධන ක්‍රමෝපාය සඳහා දිගුකාලීනව දේශපාලනික වශයෙන් උනන්දුවක් සහ කැපවීමක් ඇති කිරීම කෙරෙහි ඉතා වැදගත් වනු ඇත.

**උසස් අධ්‍යාපන අංශයෙහි නියුතු ප්‍රජාව තුළ රටෙහි බුද්ධිමතුන්ගේ සාරය අන්තර්ගත වන අතර, ඔවුනට රටෙහි ආර්ථික සහ මානව සංවර්ධනය සඳහා දායක වීමේ සුවිශේෂී හැකියාවක් ඇත.** කෙසේ වෙතත්, මෙම හැකියාව අතීතයේදී ප්‍රමාණාත්මකව අව භාවිතයෙහි පැවතුණු අතර මේ සඳහා උසස් අධ්‍යාපන අංශය මුහුණ පෑ විවිධ බාධා යම් ප්‍රමාණයකට හේතු වූ අතර, අංශය තුළ පැවැති දුර්වලතාද මීට බලපෑවේය. රටෙහි උගත් ප්‍රජාව, උසස් අධ්‍යාපන සංවර්ධන ක්‍රියාවලි සඳහා ප්‍රධානත්වය ගැනීම, සහභාගීත්වය සහ ඒ සඳහා සහයෝගය දැක්වීම අවශ්‍ය කෙරේ. මෙම සංවර්ධන ක්‍රියාවලිය, සමස්ත අංශය, අංශය තුළ ඇති තනි ආයතන සහ ආයතන තුළ ඇති තනි වැඩසටහන් සහ පාඨමාලා යන මෙම මට්ටම් ඇතුලු බහුවිධ මට්ටම් (ස්තර) වලදී සිදුවිය යුතු වේ. උසස් අධ්‍යාපනයෙහි නිරත ප්‍රජාව, මෙම එක් එක් මට්ටමක් යටතේම ක්‍රියාත්මක වන අතර, මෙම එක් එක් ක්ෂේත්‍රය ඔස්සේ සියලු ක්ෂේත්‍ර කරා සංවර්ධනය ඇතිකොට ස්ථාපනය කළ හැකි අතර එසේ කළ යුතු ද වේ.